යුක්තිය ඔබ වෙත

ජාතික නීති සතිය 2017

# නීති අත්පොත

## නීතිමය උපදෙස් සරල බසින්

ශ්‍රී ලංකා නීතිඥ සංගමය

# නීති අත්පොත

## නීතිමය උපදෙස් සරල බසින්

# ජාතික නීති සතිය 2017 කමිටුව

කුවේර ද සොයිසා, ජනාධිපති නීතිඥ - සභාපති

නිශාන් ප්‍රේමතිරත්න - කැඳවුම්කරු

නදුන් විජයශ්‍රීවර්ධන - ලේකම්

අමීර් මහරූෆ් - උපලේකම්

නුවන් බෝපෙගේ - ප්‍රධාන සම්පාදක

නවීන් හෙට්ටියාදුරගේ - සංවිධායක (කොළඹ සැසිවාර)

නලින් සමරකෝන් - සංවිධායක (කොළඹ නීති ආධාර කඳවුර)

හර්ෂණ රණසිංහ - භාණ්ඩාගාරික

යසිත් හිරිඹුරේගම - සංවිධායක (කොළඹ සැසිවාර)

කතිල් මද්දුමගේ - සංවිධායක (කොළඹින් බැහැර නීති ආධාර කඳවුරු)

යජිෂ් තෙන්නකෝන් - සංවිධායක කමිටු ප්‍රධානී

සුබාශිනී ජයලත් - මාධ්‍ය කළමනාකරණ ප්‍රධානී

සංජේ ෆොන්සේකා - උපදේශක ජාතික නීති සතිය 2017

ජනිත් ප්‍රනාන්දු

ධාන්‍යය ගුණවර්ධන

සතිෂා අබේසිංහ

ඉමාෂා මොහොට්ටි

සාලින්ද කුරේන්

රෂිනි බාලසූරිය

අර්ජුන් කුමාර් සෙල්වරාජා

ඉසුරි ජයවර්ධන

සුලෙයිමන් රම්ස්

නයන්ති වන්නිනායක

ඉමිහිරි විරරත්න

සවින්දි විතාන

ශානි මැකී

නෙළුම් ජයසිංහ

සස්මිනි දූනුවිල බණ්ඩාර

ජෙසිකා මාතියාස්

දමිතු සූරසේන

නිලුපුල් ගලප්පත්ති

මයුක දහම් පතිරණ

සෙනාලි උඩුගම

ක්ලිෆර්ඩ් ප්‍රනාන්දු

සංජීව රුවන්පතිරණ

කසුන් ගුණවර්ණසූරිය

දිනේෂ් ජයවීර

ජයතු වික්‍රමසූරිය

නිරෝෂන් සිරිවර්ධන

# හැඳින්වීම

අපි බොහෝම දෙනෙක් නීතිය කියලා හිතන් ඉන්න දේ ඇත්තටම නීතියද?ඒ නීතිය තියෙන්නේ කා වෙනුවෙන්ද?වගේ ප්‍රශ්න ඔබට සමහර විට මතුවෙලා ඇති.සාමාන්‍යයෙන් අපේ බොහොම දෙනෙක් නීතිය කිව්වම මතකයට නගා ගන්නේ පොලීසිය.තවත් සමහර අය ඊට ටිකක් ඉදිරියට ගිහින් උසාවි, නීතීඥවරු, විනිසුරුවරු නීතිය විදියට දකිනවා.

කොහොම උනත් ඇත්ත වශයෙන්ම නීතිය කියන්නේ ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය සකස් කරලා පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රිවරු සම්මත කරන අණ පනත් තමයි.ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව පත් කරන්නේ ඔබේ ඡන්දයෙන් නිසා උපකල්පනයක් තියෙනවා ඒ අය සාමාන්‍ය මිනිස්සු වෙනුවෙන් තමයි නීතී හදන්නේ කියලා.ඒත් ඇත්ත ඊට ගොඩක් දුරයි. අපේ රටේ බොහොමයක් නීති සම්මත වෙන එක ගැනත් ඒ නීති වල තියෙන්නේ මොනවද කියලවත් මිනිස්සු දන්නේ නැහැ.

හැබැයි නීති හැදුනට පස්සේ ඒ නීති අපි දන්නේ නැති උනත් ඒ නිති වලට අපි කැමති උනත් නැතත් අපිට අවනත වෙන්න වෙනවා.ඒ නිසා අපිට එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන්න වෙන ගැටලු වලදී නීතිය සහ එය ක්‍රියාත්මක වෙන ආකාරය ගැන යම් දැනීමක් තියෙන්න ඕනෑ.එහෙම දැනුමක් නැතිකම හින්දා අපිට සමහර විට මේ ක්‍රමය තුල විසඳුම් ගන්න පුලුවන් ආකාරයේ සමහර ගැටලු සඳහා විසඳුම් ගන්න බැරි වෙලා අපි අසරණ වෙන අවස්ථා තියෙනවා.

අනෙක් අතට නීතීඥවරු සහ විනිසුරුවරු ඉන්නේ ඔබට සේවය කරන්න.බොහෝ විට ඒ වගේ තනතුරු සාමාන්‍ය මිනිස්සුන්ගෙන් ඈත්වෙලා වෙනම කුලකයකට අයිතිවෙන

ආකාරයට හැසිරෙන්නෙත් සාමාන්‍ය මිනිස්සුන්ට නීතිය ගැන ඇති දැනුමේ අඩුකම මත.ඒ වගේම නීතීඥවරු විදියට පෙනී ඉන්න සමහරක් කූඨ තැනැත්තැන් සහ තවත් අතරමැදියන්ට ඔබව හසුවන්න ඉඩ තියෙනවා.

මේ සියලු කරුණු සලකා බලල තමයි නීතීඥ සංගමයේ නීති සතිය සංවිධානය කරන කමිටුව මේ සරල පොත් පිංච සමාජ ගත කරන්න හිතුවේ. මේ පොත තුල එදිනෙදා ඔබට හමුවන ගැටලු වලදී නීතිය සහ අධිකරණය වැනි ආයතන ගැන ඔබ දැනගත යුතු වැදගත් කරුණු ටිකක් සාකච්ඡා කරලා තියෙනවා.සම්පූර්ණ වශයෙන් නීතිය පිලිබදව දැනුමක් දෙන්න මේ පොතෙන් උත්සාහ කරන්නේ නැහැ.නමුත් ඔබට එදිනෙදා ජීවිතයේ වැදගත් වන බොහෝ කරුණු මෙහි ඇතුලත් කරලා තියෙනවා.

# නීති සතිය කමිටුවේ පණිවිඩය

ජාත්‍යන්තර අධිකරණයේ හිටපු කීර්තිමත් විනිසුරුවරයෙකු වූ සි. ජී. වීරමන්ත්‍රී මැතිතුමාගේ සංකල්පයක් මත 2006 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජාතික නීති සතිය, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ වාර්ෂික දිනපොතෙහි ප්‍රමුඛ ස්ථානයක් උසුලන අංගයක් වන අතර මෙම වසරේ දී අතිඋත්කර්ෂවත් ලෙස පැවැත්වීමට සියළු කටයුතු යොදා ඇත. 2017 වසරේ පවත්වනු ලබන ජාතික නීති සතිය වැඩසටහනෙහි එක් වැදගත් අංගයක් ලෙස, නීති අත්පොත, ලෙස සංස්කරණය කොට ඇති මෙම ග්‍රන්ථය මගින් දෛනික ජීවිතයට අදාල මූලික නීතිමය කරුණු කිහිපයක් සංක්ෂිප්තව සරල බසින් පැහැදිලි කරලීම මෙම කෘතියේ අරමුණ වේ.

**කුවේර ද සොයිසා, ජනාධිපති නීතිඥ**
**සභාපති**
**ජාතික නීති සතිය 2017**

**නිශාන් ප්‍රේමතිරත්න**
**කැඳවුම්කරු**
**ජාතික නීති සතිය 2017**

ජාතික නීති සතිය 2017
සංවිධායක කමිටුව වෙනුවෙන්

**විමසීම්**

**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**

**අංක 153, මිහිඳු මාවත, කොළඹ 12**

**දුරකථන : 0112447134**

**විද්‍යුත් ලිපිනය : basl.lawnet@gmail.com**

# සංස්කාරක මඩුල්ල

නීතීඥ නුවන් බෝපෙගේ

නීතීඥ මංජු ශ්‍රී චන්ද්‍රසේකර

නීතීඥ තනුක මාධව

නීතීඥ සුරංග බණ්ඩාර

නීතීඥ තිලක් විජේසිංහ

නීතීඥ කලනි මැදගොඩ

# පටුන

1. ඔබට දැනගැනීමට වැදගත් කරුණු අධිකරණ වර්ගීකරණය ඇසුරින්
    a. මහේස්ත්‍රාත් අධිකරණය
    b. දිසා අධිකරණය
    c. මහාධිකරණය
       වාණිජ මහාධිකරණය
       සිවිල් අභියාචන මහාධිකරණය
    d. අභියාචනාධිකරණය
    e. ශ්‍රේෂ්ඨාධිකරණය

2. ඔබට දැනගැනීමට වැදගත් කරුණු නඩු වර්ගීකරණය ඇසුරින්
    a. අපරාධ නඩු
    b. ඉඩම් නඩු
    c. බුදල් නඩු
    d. බෙදුම් නඩු
    e. මුදල් අයකර ගැනීම සඳහා නඩු
    f. කල්බදු/කුලී සින්නක්කර/ක්‍රෙඩිට් කාඩ් නඩු
    g. දික්කසාද නඩු
    h. වන්දි නඩු
    i. විශේෂ නඩු
    j. භාර නඩු
    k. 66 වගන්තිය යටතේ නඩු
    l. රජයේ ඉඩම් පිලිබඳ නඩු
    m. මානව හිමිකම් නඩු
    n. පරිපාලන නඩු
    o. කාර්මික නඩු

p. කුලවැද්දුම් නඩු
q. නඩත්තු නඩු

3. ආරවුල් විසදීම සදහා වැදගත් වන වෙනත් ආයතන සහ ව්‍යුහයන්

a. සමථකරණය
b. බේරුම්කරණය
c. කම්කරු විනිස්චය සභාව
d. කම්කරු කොමසාරිස්
e. ණය සහන මණ්ඩලය
f. ගෙවල් කුලී මණ්ඩලය
g. ඉඩම් අත්පත් කරගැනීමේ වන්දි සමාලෝචන මණ්ඩලය
h. මානව හිමිකම් කොමිෂන් සභාව
i. නීති ආධාර කොමිෂන් සභාව
j. ජාතික පොලිස් කොමිෂම
k. ළමා ආරක්ෂන අධිකාරිය
l. පාරිභෝගික අධිකාරිය
m. පුවත්පත් පැමිණිලි කොමිෂම
n. නීතිඥ සංගමය
o. වෛද්‍ය සභාව
p. කාති උසාවිය
q. වකුෆ් මණ්ඩලය

4. ඔප්පු ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු
5. නඩු කටයුතු වලදී දැනගත යුතු වෙනත් කරුණු

# (1)

## 1. අධිකරණ පද්දධතිය හා බැඳුනු වැදගත් කරුණු

ඔබට එදිනෙදා ජීවිතයේදී හමුවන අධිකරණයක් වෙත යාම දක්වා දිග්ගැස්සෙන ගැටලු සියල්ල පොදුවේ කාණ්ඩ දෙකකට බෙදන්න පුලුවන්.ඒ සිවිල් ආරවුල් සහ අපරාධ ආරවුල් විදියට.එම ආරවුලේ ස්වභාවය අනුව යා යුතු අධිකරණය තීරණය වෙනවා.යම් මිනිස් ජීවිතයකට හෝ දේපලට විරුද්ධව සිදුවන වැරදි අපරාධ විදියට සලකනවා. අපරාධ වරදකදී අධිකරණය සිදුකරන්නේ වරදකරුට දඩුවමක් ලබාදීම. පොලීසිය සහ නීතිපති දෙපාර්තමේන්තුව තමයි පැමිණිල්ල මෙහෙයවන්නේ.

සිවිල් වැරදි කියන්නේ ඉඩම් සම්බන්ධ ආරවුල්, දික්කසාද, මානව හිමිකම් නඩු වගේ අපරාධ නොවන ආරවුල් .

අපරාධ සම්බන්ධව මුල් අධිකරණ බලය තිබෙන්නේ මහේස්ත්‍රාත් අධිකරණයට.සාමාන්‍යයෙන් ඔබ පොලිස් අධිකරණය කියලත් මෙම අධිකරණය හඳුන්වනවා.

## 1.a <u>මහේස්ත්‍රාත් අධිකරණය</u>

**ඔබ අපරාධයකට මුහුණ දී ඇති විටක**

ඔබට යම් අපරාධයක් හෝ ඒ හා සමාන ආරවුලකට මුහුණ දුන්විට මුලින්ම පොලීසියකට පැමිණිල්ලක් කරනවා.පොලීසියේදී හොදින්ම දැනගන්න අවශ්‍ය කරුණ තමයි ඔබ කරන පැමිණිල්ල මුල්ම තොරතුර වන නිසා එය ඉතාම නිවැරදිව සටහන් කරන්න ඕනෑ.හැකියාවක් තියෙනවනම් නීතීඥ මහත්මයෙක් එක්ක යන්න පුලුවන්නම් හොදයි.

අපරාධය කරපු තැනැත්තා හඳුනා ගන්න බැරිනම් ඒ බව පැමිණිල්ලේ සදහන් කරන්න අපරාධකරුගේ හැඩරුව සමග.අපරාධය වුණු ස්ථානයේ අපරාධයට සම්බන්ධ යම් භාණ්ඩ හරි සාක්ෂි හරි තියෙනවනම් ඒවා විනාශ වෙන්නේ නැතිව , අස්ථානගත කරගන්නේ නැතිව පොලීසිය එනකන් තබාගන්න වගබලා ගන්න ඕනෑ.ඇසින් දුටු සාක්ෂිකරුවෝ ඉන්නවනම් ඒ අයගේ විස්තරත් එකතු කරගන්න කටයුතු කරන්න ඕනෑ.අපරාධය නිසා ඔබව හෝ මුහුණ දුන් කෙනා හෝ රෝහල් ගත කිරීමට සිදුවන වෙලාවක කටඋත්තර ගන්න රෝහල් පොලීසියක් තියෙනවා.ඔබගේ මානසික තත්ත්වය හොද වෙනකන් කටඋත්තර දෙන්න යන්න එපා.මොකද කටඋත්තරයේ යම් මගහැරීමක් උනොත් අපරාධකරුට ඒකේ වාසිය ගන්න පුලුවන්.

අපරාධය සම්බන්ධව ඔබ මුල් තොරතුර දුන්නට පස්සේ පොලීසියේ වගකීම තමයි අපාරාධයක් සිදුවෙලා තියෙනවනම් නඩුව පවරා ඔබ වෙනුවෙන් පවත්වාගෙන යන එක.පොලීසිය මොකක් හරි හේතුවක් නිසා නඩුවක් පවරන්නේ නැත්නම් ඔබට

පුද්ගලිකව පැමිණිල්ලක් උසාවියේ පවරන්න පුලුවන්.ඒත් පොලීසිය මගින්ම නඩු පවරන තැනට කටයුතු කරගන්න පුලුවන්නම් හොදයි.පොලීසිය අසාධාරණ ලෙස නඩු පැවරීම මගහරිනවනම් පොලිස්පතිවරයාට හරි පොලිස් කොමිසමට හරි පැමිණිල්ලක් දාලා පොලීසියට බලපෑම් කරන්න පුලුවන්.මානව හිමිකම් කොමිෂන් සභාවටත් පොලීසියේ පැහැරහැරීම් ගැන පැමිණිලි කරන්න පුලුවන්.

ඔබ මුහුණ දුන්න අපරාධය ස්වභාවය අනුව පොලීසියට අපරාධකරු වරෙන්තුවක් නැතිව අත්අඩංගුවට ගන්න පුලුවන් වරදක් වෙන්නත් පුලුවන් නැත්නම් වරෙන්තුවක් අවශ්‍ය වරදක් වෙන්නත් පුලුවන්.ඒ අනුව පොලීසිය අපරාධකරු අත්අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්නේ හෝ අත්අඩංගුවට ගැනීම සදහා වරෙන්තු නිකුත් කරවා ගන්නේත් මහේස්ත්‍රාත් අධිකරණය මගින්.පොලීසිය මුලින්ම මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු දක්වන ලියවිල්ලට සාමාන්‍යයෙන් කියන්නේ බී වාර්තාව කියලා.

පොලීසිය ඉදිරිපත් කරන වාර්තාව බලල අපරාධයක සැකකරු උසාවිය ඉදිරියේ ඉන්නවනම් මහේස්ත්‍රාත් අධිකරණය තීරණය කරනවා තමන්ටම දඩුවම් දෙන්න පුලුවන් සාමාන්‍ය වරදක්නම් නඩුව අහල තින්දුවක් දෙන්න.අපරාධකරු ඔබ නමින් හදුනන්නේ නැත්නම් හදුනා ගැනීමේ පෙරෙට්ටුවකට දානවා.එතනදී ඔබගේ වගකීම තමයි හරියට වරදකරුව හදුනාගැනීම.මිනීමැරීම වගේ දරුණු අපරාධ වලට දඩුවම් දෙන්න මහේස්ත්‍රාත් අධිකරණයට බැහැ.ඒක කරන්න පුලුවන් මහාධිකරණයට.ඒ වගේ වෙලාවකදී මහේස්ත්‍රාත් අධිකරණය පරීක්ෂණයක් තියලා මහාධිකරණයට යොමු කරන්න පුලුවන් තත්ත්වයක් තියෙනවද කියලා බලනවා.

ඔබ අපරාධයකට ලක්ව සිටින අවස්ථාවක ඔබට හරි සාක්ෂිකරුවන්ට හරි අපරාධය කල තැනැත්තා විසින් යම් තර්ජනයක් කරනවානම් ඒ ගැන ඉක්මනටම අධිකරණයට හරි

පොලිසියට හරි පැමිණිලි කරන්න ඕනෑ.එවන් විටක අධිකරණයට එම තැනැත්තාගේ ඇප අවලංගු කරන්න පුලුවන්.ඒ වගේම අපරාධ වින්දිතයින් ආරක්ෂා කරන්න පනතක් තියෙනවා.එම පනත යටතේ අදාල තැනැත්තා අත්අඩංගුවට ගන්න පුලුවන්.

**ඔබ අපරාධයක සැකකරුවකු වී ඇති විටක**

ඔබව පොලීසියට අත්අඩංගුවට ගන්න පුලුවන් පහත අවස්ථාවලදී පමණයි

1. ඔබ අපරාධ වරදක් සිදුකල අවස්ථාවේදී හරි සිදුකර ඇති විටකදී.
2. ඔබ අපරාධයකට සැකකරන කෙනෙක් හරි සැගවී පලා යන අවස්ථාවකදී,
3. අපරාධයකට අදාල සාක්ෂි ඔබ විනාශ කරන බවට සැකකරන අවස්ථාවකදී,
4. ඔබ සාක්ෂිකරුවෙකුට බලපෑම් කරනවා කියලා සැක හිතෙන වෙලාවකදි,

ඔබට විරුද්ධව අපරාධයක චෝදනාවක් ඉදිරිපත් වී ඇති විටක පොලීසියට ඔබව වරෙන්තුවක් නැතුව අත්අඩංගුවට ගන්න පුලුවන් වැරදි තියෙනවා. ඒ වගේම සමහර වැරදි වලදි අනිවාර්යයෙන්ම අධිකරණයෙන් වරෙන්තුවක් අරගෙන තමයි අත්අඩංගුවට ගන්න පුලුවන්.

කොහොම නමුත් අත්අඩංගුවට ගන්න වෙලාවේදී ඔබට විරුද්ධව ඇති චෝදනාව පැහැදිලි කර දෙන්න පොලීසිය බැදිලා ඉන්නවා.ඔබ කාන්තාවක් නම් අනිවාර්යයෙන්ම ඔබව පරික්ෂා කිරීමක් සිදු කිරීමේදී කාන්තා පොලිස් නිළධාරිනියක් ඉන්න

ඕනෑ.ඒ වගේම අත්අඩංගුවට ගන්න වෙලාවේදී කෲර සහ අවමන් සහගත සැලකිලි වලට ලක්කරන්න පොලීසියට බැහැ.ඔබට විරුද්ධව වරෙන්තුවක් තියෙනවනම් ඒක පරික්ෂා කරලා බලන්න ඔබට අයිතිය තියෙනවා.ඒ වගේම ඔබගේ පවුලේ සාමාජිකයන් හෝ හිතවතුන් රදවා තබාගෙන ඔබට අත්අඩංගුවට පත්වීමට බලකරන ආකාරයේ ක්‍රියා කරන්න පොලීසියට බැහැ.

ඔබ අත්අඩංගුවට ලක්වුනු වරද ඉතා සාමාන්‍ය වරදක්නම් පොලීසියටම පුලුවන් පොලිස් ඇපයක් දීලා ඔබට මුදා හරින්න.නැත්නම් පැය 24 ක් ඇතුලත අනිවාර්යයෙන්ම ඔබව මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරන්න ඕනෑ.විශේෂ අවස්ථා තියෙනවා පැය 48 දක්වා තියාගන්න පුලුවන්.ඒ සදහාත් අධිකරණයේ අවසරයක් ගන්න ඕනෑ.

ඔබ අත්අඩංගුවේ සිටින කාලය තුල ආහාර පාන ලබාදී මූලික අවශ්‍යතා ඉටු කරන්න පොලීසිය බැදිලා ඉන්නවා.ඔබට යම් තුවාල සිදුවීමක් තියෙනවනම් අධිකරණ වෛද්‍ය නිළධාරි වරයෙක් ලගට ඔබව එක්කගෙන යන්න කියලා ඉල්ලන්න.ඔබ අත්අඩංගුවේ ඉන්නවා කියලා ඥාතීන්ට හරි භාරකරුවෙකුට හරි දන්වන්න ඔබට අයිතිය තියෙනවා.විශේෂයෙන්ම ලමයෙක් නම් අනිවාර්යයෙන්ම භාරකරුවෙකු යටතේ තමයි අත්අඩංගුවේ තබාගන්න පුලුවන්.ඒ වගේම පවුලේ ඥාතීන්ට සහ නීතිඥවරුන්ට ඔබව මුණ ගැසීමේ සම්පූර්ණ අයිතිය තියෙනවා.අත්අඩංගුවේදී පොලීසියේ අවශ්‍යතා ඉටුකරන්න ඒ කියන්නේ පොලිස් නිළධාරින්ට ආහාර පාන ලබාදෙන්න,පොලිසිය පිරිසිදු කරන්න වැනි කටයුතු කරන්න ඔබ බැදිලා නැහැ.ඒ වගේ දේවල් කිව්වොත් ප්‍රතික්ෂේප කරන්න.

අත්අඩංගුවේදී ඔබෙන් කටඋත්තර ගන්න විට ඔබගේ මවු භාෂාවෙන් තමයි කටඋත්තරය ගන්න ඕනෑ.ඒ අත්සන් කරන්න කලින් කිහිපවතාවක්ම කියවලා හරිනම් විතරක් අත්සන්

කරන්න.පොලීසිය අහන දේවල් සියල්ලටම මොකක් හරි උත්තරයත් දෙන්න කියලා නියමයක් නැහැ.අනවශ්‍ය ප්‍රශ්න වලට උත්තර දෙන එක ප්‍රතික්ෂේප කරන්න පුලුවන්.ඔබ අපරාධය වුනු ස්ථානයේ සිටිය නැති කෙනෙක්කම් මුල් කටඋත්තරයේදීම ඒබව සටහන් කරන්න ඕන.

මීලගට වැදගත් වන්නේ අධිකරණයට ඉදිරිපත් කිරීමක් සිදු වුනහොත් ඔබ විසින් දැනගත යුතු කරුණු.

බී වාර්තාවක් මත ඔබව අධිකරණයට අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කලහොත් මුලින්ම නීතීඥවරු මාර්ගයෙන් හරි ඔබට තමන් විසින්ම හරි ඇප ලබා ගැනීමට ඉල්ලීමක් කරන්න වෙනවා. මහේස්ත්‍රාත් අධිකරණයට ඇප ලබා දෙන්න පුලුවන් වරදක් නම් පහත කරුණු එකක් හරි කිහිපයක් හරි ඔප්පු කරන්න පුලුවන් වුනොත් අනිවාර්යයෙන්ම ඇප ගන්න පුලුවන්.මොකද ඇප දෙන එක තමයි අධිකරණයේ යුතුකම. ඇප නොදීම කියන එක වැදගත් හේතුවක් නැත්නම් මිස අධිකරණයට කරන්න බැහැ.

i. ඔබ අධිකරණය මග හරින්නේ නැතිව දිගටම අධිකරණයට එන තැනැත්තෙකු කියන එක
ii. නඩුවේ සාක්ෂිකරුවන්ට ඔබෙන් කිසිදු බලපෑමක් සිදු නොවන බව
iii. ඔබගෙන් පරීක්ෂණ වලට බාධාවක් නොවන බව

සමහර අවස්ථාවල ඇප ලැබුනත් රක්ෂිත බන්ධනාගාර ගත වෙන්න පුලුවන් ඔබට නියම කරපු ඇප තියන්න බැරි වුනොත්.කරන ලදැයි සැක කරන වරද අනුව සමහර අවස්ථාවල අධිකරණය ලගම ඥාතීන් ඇපකරුවන් විදියට තියන්න නියම කරනවා.අධිකරණ බල සීමාව තුලම ජීවත් වන අයව ඇපකරුවන් විදියට තියන්න නියම කරනවා.නැත්නම් ග්‍රාමසේවා සහතික

ඉදිරිපත් කරන්න කියනවා.ඒ නිසා ඇප ගැනීමට ඉල්ලීමක් කරන්න කලින් අඩුම තරමේ ඥාතීන් හරි මිතුරන් හරි දෙදෙනෙක් හොයාගෙන ග්‍රාමසේවා සහතික අරගෙන දිසාපති කාර්යාලයෙන් එය සහතික කරගෙන සූදානම් කරගන්න.

සමහරවිට අධිකරණය ඔබගේ විදේශ ගමන් බලපත්‍රය සිය භාරයට ගෙන විදේශ ගමන් අත්හිටුවන්න පුලුවන්.පොලිසියට මාසිකව හෝ සතිපතා වාර්තා කිරීම හරි වෙනත් ඒ ආකාරයේ වැරදි කිරීම තහනම් කරලා හරි ඇප කොන්දේසි පනවන්න පුලුවන්.ඔබ එවැනි ඇප කොන්දේසි නියම කරපු වෙලාවට ඒවාට අවනත නොවුනොත් ඇප අවලංගු කරලා බන්ධනාගාර ගත කරන්න අධිකරණයට පුලුවන්.

යම් විදියකින් අධිකරණය සෑහීමකට පත් නොවුනොත් ඔබව උපරිම දින 14කට රක්ෂිත බන්ධනාගාර ගත කරන්න පුලුවන්. හුගක් වෙලාවට පොලීසිය පරීක්ෂණ අවසන් නෑ කියලා ඇප ලබාදීමට විරුද්ධ වෙනවා.ඔබ පරීක්ෂණ වල තත්ත්වය ගැන සැලකිල්ලෙන් හිටියොත් ඊට විරුද්ධව අධිකරණයට කරුණු දක්වන්න පුලුවන්.

සමහර වැරදි වලට මහේස්ත්‍රාත් අධිකරණයට ඇප දෙන්න බැහැ.උදාහරණ විදියට මිනීමැරීම,රාජ්‍ය විරෝධි වැරදි වගේ දේවල්. ඒ වගේම පොදු දේපල සම්බන්ධව කරන වැරදි, නවක වදය, අන්තරයාකර ආයුධ ලග තබා ගැනීම,තුවක්කු පනත,පීඩාකාරි ආයුධ පනත,මත්ද්‍රව්‍ය පනත, පුරාවිද්‍යා වටිනාකමක් ඇති දේවල් සම්බන්ධ වැරදි වගේ වැරදි වලට ඇප ගන්න පුලුවන් මහාධිකරණයෙන් හරි අභියාචනාධිකරණයෙන් හරි පමණයි.

නමුත් පොදු දේපල පනත වගේ පනත්වල ඇප බලය මහාධිකරණයට දීලා තිබුනත් බන්ධනනාගාර ගත වීමෙන් තමන්ට විශාල අගතියක් වන බව තහවුරු කලොත් මහේස්ත්‍රාත් අධිකරණයට ඇප දීමේ හැකියාව තියෙනවා.

සමහර අවස්ථාවල ඔබට යම් වරදක චූදිතයෙකු විදියට හරි නඩුවක සාක්ෂි කරුවකු විදියට හරි අධිකරණයට එන්න කියලා සිතාසියක් ලැබෙන්න පුලුවන්.එම සිතාසිය ඔබගේ ලිපිනය සොයා ගන්න බැරි වෙලාවක පවුලේ සාමාජිකයෙකුට හරි සේවකයෙකුට හරි භාරදෙන්න පුලුවන්.එවැනි වෙලාවක ඒ සිතාසියට ගරු කරලා අධිකරණය වෙත ඉදිරිපත් වෙන්න ඕනෑ.

ඒ වගේම ඔබ අධිකරණයේ පෙනී නොසිටියහොත් හරි අධිකරණය මගහැරලා සිටියොත් හරි වරෙන්තුවක් ගන්න පොලිසියට පුලුවන්.ඒ බව දැනගත්ත වහාම අධිකරණයට මෝසමක් දාලා ඉදිරිපත් වෙලා වරෙන්තුව ආපසු කැදවගන්න ඕනෑ.නැත්නම් ඔබව පොලීසියට අත්අඩංගුවට අරගෙන එම වරෙන්තුව නිකුත් කල මහේස්ත්‍රාත් අධිකරණයට හරි අත්අඩංගුවට ගත් තැනට ආසන්න මහේස්ත්‍රාත් අධිකරණයට හරි ඉදිරිපත් කරන්න පුලුවන්.එවැනි අවස්ථාවකත් ඔබ ඇප ඉල්ලන්න සූදානම් වෙලා ඉන්න ඕනෑ.වරෙන්තුවක් ආපසු කැදවූ විටක අධිකරණ කාර්යාලයෙන් ලිපියක් නිකුත් කරනවා. මතක ඇතිව එම ලිපිය ලග තබා ගන්න ඕනෑ.නැත්නම් පොලිසිය වරෙන්තුව තිබෙනවා යන පදනම මත ඔබව අත්අඩංගුවට ගන්න පුලුවන්.

ඔබගේ නිවස හරි වෙනත් ස්ථානයක් හරි කෙනෙක් අයුතු සිරකර තැබීමකට භාවිත කරන බවට සැකයක් තියෙනවනම්,එහෙම තැනක සොරබඩු හරි වෙනත් අපරාධයකට අදාල භාණ්ඩ

තියෙනවනම් පොලීසියට සෝදිසි වරෙන්තුවක් අරන් එතැන පරීක්ෂා කරන්න පුලුවන්.

අවසානයේ ඔබට විරුද්ධව නඩුව විභාග කිරීම ආරම්භ වුනොත් ඔබ නීතීඥවරුන් මාර්ගයෙන් හරි ඔබ විසින්ම හරි අධිකරණයට ඔබ එම වරද නොකල බවට සාධාරණ සැකයක් ඇති කලහොත් ඔබට වරදින් නිදහස් වන්න පුලුවන්. අනෙක් අතට මුල් අවස්ථාවේදීම ඔබට විරුද්ධව ප්‍රමාණවත් සාක්ෂි නැත්නම් ඔබව මුදා හරින්න ඉල්ලීමක් කරන්න පුලුවන්.

යම් තැනැත්තෙක් රක්ෂිත බන්ධනාගාර ගත වෙලා ඉන්නවා කියන්නේ ඔහු වැරදිකරුවෙකු වුනා කියන එක නෙමෙයි.අධිකරණයකින් වැරදි කරුවෙකු කරනකම් සෑම කෙනෙක්ම සැකකරුවෙකු විතරයි.

යම් අපරාධයකට ළමයෙකු ලක්ව තිබෙනවනම් හරි අපරාධයක් කරලා තියෙනවනම් හරි ඒ සඳහාම විශේෂ වුනු ළමා මහේස්ත්‍රාත් අධිකරණයක් තියෙනවා.එම අධිකරණයට දරුවන්ගේ ආරක්ෂාව සහ ලමයෙකු අපරාධයක් කරල තියෙන කොට ඒ සම්බන්ධව විභාග කර දඩුවම් කිරීම වැනි කරුණු ගැන නියෝග දෙන්න පුලුවන්.

සිවිල් ආරවුල් වල ස්වභාවය ගන්නා ඉඩමක් සම්බන්ධව සිදුවන සාමය කඩවීමක් හෝ මහජන පීඩාවක් සිදුවන අවස්ථාවක් සම්බන්ධවද මහේස්ත්‍රාත් අධිකරණයට නියෝග දෙන්න පුලුවන් අවස්ථා තියෙනවා.ඒ ගැන මින් ඉදිරියට සාකච්ඡා කෙරෙනවා.

තවද විවාහක පාර්ශවයකට අනෙක් පාර්ශවයෙන් හෝ දරුවන්ට දෙමාපියන්ගෙන් හෝ නඩත්තු ලබා ගැනීම සඳහාද නඩු පැවරිය යුත්තේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත වේ.

## 1.b <u>දිසා අධිකරණය</u>

දිසා අධිකරණයට තමයි සිවිල් ආරවුල් ගැන මුල් අධිකරණ බලය තියෙන්නේ.සිවිල් ආරවුල් කිව්වම වැඩිය තේරෙන්නේ නැහැ ගොඩක් අයට.දිසා අධිකරණයේ නඩු වර්ග කරන ආකාරය විස්තර කලවිට සිවිල් ආරවුල් තේරුම් ගන්න පුලුවන්.

i. ඉඩම් නඩු
ii. බුදල් නඩු
iii. බෙදුම් නඩු
iv. මුදල් අයකර ගැනීම සඳහා නඩු
v. ගෙවල් කුලී නෙරපීම් නඩු
vi. දික්කසාද නඩු
vii. වන්දි නඩු

සිවිල් ආරවුල් වලදී අපරාධ නඩු වගේ නෙමෙයි නඩු පැවරීමට කාලය මගින් සීමා පනවලා තියෙනවා.ඒ සීමාවල් හරියට දැන ගෙන නොහිටියොත් අපිට නඩු පවරල සහන ගන්න බැරි වෙනවා.එහෙම සීමා කිරීම් කිහිපයක් පහත දක්වල තියෙනවා.

| | |
|---|---|
| රිය අනතුරකින් පසු වන්දි අයකර ගැනීම | අනතුර සිදුවී අවුරුදු දෙකක් ඇතුලත |
| භාණ්ඩ අත්පිට විකුණා මුදල් නොගෙවීම මත මුදල් අයකර ගැනීම | ගනුදෙනුව සිදුවී වසරක් ඇතුලත |
| වංචනික ඔප්පුවක් අවලංගු කරවා ගැනීම | වංචාව දැනගෙන වසර 3ක් ඇතුලත |
| ලිඛිත ගිවිසුමක් කඩ කල විට වන්දි අයකර ගැනීම | ගිවිසුම කඩ කල දින සිට අවුරුදු 6ක් ඇතුලත |
| චෙක්පත්/පොරොන්දු | අගරු වුනු දින සිට අවුරුදු 6 |

| | |
|---|---|
| නෝට්ටු මත මුදල් නොගෙවීම | ඇතුලත |
| දේපලක භුක්තියෙන් නෙරපූ විට භුක්තිය ලබා ගැනීම | භුක්තියෙන් නෙරපා වසරකුත් දිනයක් ඇතුලත |

දිසා අධිකරණයක නඩුව ආරම්භ වන්නේ ලිඛිත පැමිණිල්ලකින්. පැමිණිල්ල දාන්න ඕන විත්තිකරුවන් පදිංචි දිසා අධිකරණයේ හරි ඉඩමක් සම්බන්ධ නඩුවක් නම් ඉඩම පිහිටි ප්‍රදේශයේ දිසා අධිකරණයේ හරි ගිවිසුමක් සම්බන්ධවනම් ගිවිසුමට ඇතුලත් වුනු ප්‍රදේශයේ දිසා අධිකරණයේ.නඩු නිමිත්ත ඇතිවුනු ප්‍රදේශයේ දිසා අධිකරණයේ නඩු දාන්නත් පුලුවන්.උදාහරණ විදියට රිය අනතුරක් නම් අනතුර සිදුවුනු තැන, අපහාසයක් ගැන වන්දි අයකරගන්න අපහාසාත්මක ලේඛණය බෙදාහැරපු තැන වගේ.

ඉඩම් නඩු ගත්තොත් ස්වභාවය අනුව විවිධ වෙනස්කම් තියෙනවා.ඔබට ඉඩමකට ඇති අයිතිය නීතිවිරෝධීව අහිමි කරන අවස්ථාවක අයිතිය ප්‍රකාශ කරගන්න නඩු දමන්න ඕනැ. ඉඩමේ මායිම් වෙනස් කලොත් මායිම් නිශ්චය කරගන්න නඩු දමන්න ඕනැ.තමන්ට අයිතියක් නැතැත් ඉඩමට භුක්තිය තිබිල ඒක අහිමි උනොත් භුක්තිය ඉල්ලලා නඩු දාන්න පුලුවන්.දේපල හවුලේ භුක්ති විදලා තවදුරටත් එකට ඉන්න බැරිනම් බෙදුම් නඩුවක් දමන්න ඕනැ.කෙනෙක් රුපියල් මිලියන 5කට වඩා වටිනාකම වැඩි දේපල තියලා මිය ගියොත් බුදල් නඩුවක් දාලා දේපල බෙදා ගන්න ඕනැ.

මුදල් නඩු ගත්තොත් මේ වනවිට ගොඩක් තියෙන්නේ ලීසිං පහසුකම් මත වාහන අරගෙන ගෙවපු නැති නඩු සහ ක්‍රෙඩිට් කාඩ්පත් වලින් ගනුදෙනු කරල ගෙවපු නැති නඩු සහ බැංකු වලින්

ණය අරන් නොගෙවපු නඩු.ඒ නඩු දෙන පණිවිඩය තමයි තමන් අධි පාරිභෝජනයට හුරු වෙන්නේ නැතිව අතේ ඇති මුදලින් ජීවත් වෙන එක  වැදගත් කියන එක.ඊට අමතරව භාණ්ඩ හා සේවා සපයල මුදල් නොගෙවීම මත පවරන නඩු,අපහාසය සඳහා වන්දි අයකර ගන්න නඩු, රිය අනතුරු සඳහා වන්දි අයකර ගන්න නඩු,අගරු වුණු චෙක්පත් සඳහා මුදල් අයකරගන්න පවරන නඩු සුලභව දකින්න ලැබෙන මුදල් නඩු වර්ග තමයි.

දැන් දැන් වාණිජ ගනුදෙනු ඒ කියන්නේ නැව් වලින් භාණ්ඩ ප්‍රවාහනය,සමාගම් ආරවුල්, බුද්ධිමය දේපල ගැන ආරවුල් වගේ දේවල් සම්බන්ධ නඩු විශේෂ අධිකරණයක් වුනු වාණිජ මහාධිකරණයට යොමු කරන්න ඕනෑ.රුපියල් මිලියන 5ට වැඩි ණය,ලීසින් වැනි වාණිජ ගනුදෙනුත් යොමු කරන්නේ වාණිජ මහාධිකරණයට.

ඉහත ආකාරයේ සිවිල් ආරවුල් සම්බන්ධව පවරපු නඩුවක ඔබව විත්තිකාරයා වෙන්න පුලුවන්.ඔබට අධිකරණයෙන් සිතාසියක් ලැබුනම පුද්ගලිකව හරි නීතීඥවරයෙකු මගින් හරි පෙනී සිටින්න පුලුවන්. හැබැයි නීතීඥයෙකු මගින් පෙනී ඉන්නවානම් අනිවාර්යයෙන්ම පෙරකලාසිය නැත්නම් ප්‍රොක්සි එක කියන ලේඛණය මගින් නීතීඥයෙකු පත්කරන්න ඕනෑ.ඊට පස්සේ අධිකරණය කියන දිනට උත්තරය ගොනු  කලාට පස්සේ තමයි නඩු විභාගය සිදුවන්නේ.

නීතිය අනුව නඩු විභාගයට දින 15කට කලින් තමන්  නඩුවේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු  වන ලේඛණ සහ සාක්ෂි අනෙක් පැත්තට පිටපත් සහිතව ලිඛිතව අධිකරණයට ගොනු කරන්න ඕනෑ.නැත්නම් ඒ සාක්ෂි නඩු විභාගයේදී ඉදිරිපත් කරන්න බැරි වෙනවා.ඒක නිසා ඔබගේ වගකීම වෙන්නේ නඩුවට වැදගත් කියලා හිතෙන හැම ලේඛණයක්ම සහ සාක්ෂිකරුවෙක්ම නීතීඥවරයාට ලේඛණ ලැයිස්තුවට ඇතුලත් කරන්න ලබා දෙන

එක.සිවිල් නඩුවල මුලු නඩුවම වගේ රදා පවතින්නේ ලේඛන මත.ඒ නිසා නඩුව අවසාන වෙනකම් තමන්ගේ නීතීඥවරයා එක්ක හොද සම්බන්ධයක් පවත්වාගෙන යන්න ඕනැ.නීතීඥවරයාව නඩුවට කලින් කොහොමහරි හමු වෙන්න ඕනැ.

සිවිල් නඩුවක අපරාධ නඩුවක් වගේ නෙමෙයි වැඩිපුර සාක්ෂි තියෙන පැත්තට තමයි අධිකරණය තීන්දුව දෙන්නේ.ඒ කියන්නේ ඔබගේ නඩුව විරුද්ධ පැත්තට වඩා ශක්තිමත් කියලා ඔබ පෙන්වන්න ඕනෑ.නඩුව ආරම්භයේදීම දෙපැත්තම පිළිගන්න කරුණු නඩුවේ පිලිගැනීම් කියලා සටහන් කරනවා.ඊට පස්සේ දෙපැත්තම ඔප්පු කරන්න ඕන කරුණු ප්‍රශ්න විදියට සටහන් කරනවා.නඩුව අවසානයේ ඒ ප්‍රශ්න වලට විනිසුරුතුමා උත්තර දෙනවා.

මුලින්ම පැමිණිලි පාර්ශවය තමයි තමන්ගේ සාක්ෂි ඉදිරිපත් කරන්නේ.ඔබ පැමිණිල්ල නම් ඔබගේ නඩුව ඔප්පු කරන්න අවශ්‍ය සාක්ෂි සහ ලේඛණ ඉදිරිපත් කරන්න ඕනෑ.හැම සාක්ෂිකරුවෙක්ගෙන්ම අනෙක් පාර්ශවයට හරස් ප්‍රශ්න අහන්න අවස්ථාව ලැබෙනවා.ඔබට සාක්ෂිකරුවෙක් විදියට සාක්ෂි දෙන්න උනොත් සැලකිලිමත් වෙන්න ඕනැ කලබල වෙන්නේ නැතිව අහන ප්‍රශ්නෙට කෙටියෙන් උත්තර දෙන්න.ඊට පස්සේ විත්තිය පාර්ශවය තමන්ගේ නඩුව ඉදිරිපත් කරනවා.සාක්ෂි කැදවලා අවසානයේදී තීන්දුව ලබා දෙනවා.නඩු විභාගයේදී අනිවාර්යයෙන්ම ලේඛන වල මුල් පිටපත් ඉදිරිපත් කරන්න ඕනැ.මුල් පිටපත නැත්නම් සහතික පිටපත් ඉදිරිපත් කරන්න පුලුවන්.සහතික පිටපත් කියන්නේ ලේඛනයක මුල් පිටපත තියෙන ආයතනයක් තියෙනවනම් ඒ ආයතනයේ බලයලත් නිළධාරියෙකු සහතික කරන ලද මුල් ලේඛණයේ පිටපතක්.

තීන්දුව ගැන ඔබ සතුටු නැත්නම් සිවිල් නඩු අහන පලාත්බද මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුලුවන්.තීන්දුවේ දින ඉදන් දින 14 ඇතුලත අභියාචනා කරන බවට දැන්වීමක් නොතිසියක් දිසා අධිකරණයටම ලබාදෙන්න ඕනෑ.නඩු තීන්දුවෙන් දින 60 ඇතුලත අභියාචනා පෙත්සම දිසා අධිකරණයටම ගොනු කරන්න අවශ්‍යයයි.එම අභියාචනයෙන් පසුව නැවත වරක් ශ්‍රේෂ්ඨාධිකරණයට අවසාන අභියාචනය කරන්න පුලුවන්.ඒ මහාධිකරණයේ තීන්දුවේ දින සිට දින 42 ඇතුලත.

දිසා අධිකරණයකින් තීන්දුවක් දුන්නම වසර 10 ක් ඇතුලත ඒ තීන්දුව ක්‍රියාත්මක කරගන්න ඕනෑ.ඔබට යම් මුදලක් ගෙවන්න තීරණය වුනානම් එම මුදල විත්තිකරු ගෙවන්නේ නැත්නම් විත්තිකරුගේ දේපල තහනමට අරගෙන මුදල අයකරගන්න පුලුවන්.තීන්දුව මගින් ඉඩමක භුක්තිය ඔබට ගන්න අයිතිවාසිකම දුන්නොත් අධිකරණයේ නිළධාරීන් සහ පොලිසිය එක්ක ගිහින් භුක්තිය ගන්න පුලුවන්.

### 1.c <u>මහාධිකරණය</u>

අපේ රටේ මහාධිකරණ වර්ග 3ක් හඳුනා ගන්න පුලුවන් ඒවා තමයි

i. අපරාධ නඩු විභාග කරන මහාධිකරණය

ii. සිවිල් නඩුවල අභියාචනා විභාග කරන මහාධිකරණය

iii. වාණිජ ගනුදෙනු පිලිබඳව නඩු විභාග කරන වාණිජ මහාධිකරණය

අපරාධ නඩු විභාග කරන මහාධිකරණය

මෙම මහාධිකරණයේ අපරාධ නඩු මෙහෙයවන්නේ සහ නඩු පැවරීම සිදුකරන්නේ නීතිපතිවරයා විසින්.අපරාධ නඩු විභාග වන මහාධිකරණයක මූලික වශයෙන් අධිචෝදනා නගන්න පුලුවන් වැරදි සම්බන්ධව නඩු තමයි විභාග වන්නේ.මිනීමැරීම්, ස්ත්‍රී දූෂණ වගේ නඩු නීතිපතිවරයාට සාක්ෂි ඇති බවට හැගුනොත් අධිචෝදනා මගින් මහාධිකරණයට විභාගය සදහා ගොනු කරන්න පුලුවන්.ඊට අමතරව හෙරෝයින් නඩු,පීඩාකාරී ආයුධ පිලිබද නඩු,ගිනි අවි ලගතබාගැනීම පිලිබද නඩු,අල්ලස් ගැනීම් පිලිබද නඩු වගේ නඩුත් මහාධිකරණයේ විභාග වෙනවා.ඒ වගේම සමහර වැරදි සදහා ඇප ලබා ගන්නත් පුලුවන් මහාධිකණයෙන් පමණයි.

මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදුන් තීන්දු වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කරන්නෙත් මහාධිකරණයට.ඊට අමතරව කම්කරු විනිශ්චය සභාවේ තීන්දු වලට විරුද්ධවත් මහාධිරකරණයට තමයි යන්න ඕන.මහේස්ත්‍රාත් අධිකරණයේ තීන්දුවේ දිනයේ සිට දින 14ක් ඇතුලත අභියාචනය ඉදිරිපත් කරන්න ඕන.අභියාචනා කරන්න බැරි වුනොත් සාධාරණ කාළයක් තුල ප්‍රතිශෝධන ඉල්ලීමක් කරන්න පුලුවන්.මෙම මහාධිකරණයට පලාත් සභාවට බලය හිමි කරුණු සම්බන්ධව රිට් අධිකරණ බලයද ඇත.

ඔබ මහාධිකරණ නඩුවක චූදිතයෙක් නම් මුල්ම දින වරද විවෘත අධිකරණයේ කියවල ඔබ වැරදිකරුද නිවැරදිකරුද කියලා විමසනවා.ඔබ ඒ වගේ නඩුවක මුලින්ම සුදුසු නීතීඥයෙකු කල්තියාම හම්බ වෙලා උපදෙස් ගන්න ඕනැ.නඩුව දවස උදේ උසාවියෙන් නීතීඥයෙක් හොයාගන්න යාම තුල ඔබව අනවශ්‍ය පුද්ගලයින් සහ නුසුදුසු නීතීඥයින්ගෙන් රැවටීමට ලක්වන්න පුලුවන්.කල්තියාම නීතීඥයෙක් හමුවෙලා වරද පිලිගන්නවද

නැද්ද කියලා තීරණය කරන්න.සමහර අවස්ථාවල වරද පිලිගැනීම මගින් උපරිම දඩුවම වෙනුවට අවම දඩුවමක් ලබාගන්න පුලුවන්.

වරද පිලිගන්නේ නැත්නම් නඩුව විනිශ්චයකාරවරයෙක් ඉදිරියේදී විභාගයට ගන්නවා.මිනීමැරීම,ස්ත්‍රී දූෂන මිනිමැරීමට තැත් කිරීම වගේ වැරදි සදහා අවශ්‍යනම් ජූරි සභාවක් ඉල්ලන්න පුලුවන්.නඩුවට නීතීඥයෙක් පත්කරගන්න අමාරුනම් මුල් දිනයේම අධිකරණයට දන්වලා රජයේ වියදමින් නීතීඥයෙක් පත්කර ගන්න පුලුවන්.ඊට අමතරව ග්‍රාමසේවක සහතික සහිත ඇපකරුවන් දෙදෙනෙක්වත් මුල් දිනයේ උසාවිට එක්කගෙන යන එක වැදගත්.මුදලින් ඇප තියන්න කිව්වාත් ඒකටත් කලින් සූදානමකින් ඉන්න ඕනෑ.ඔබ නීතීඥවරුන්ට ගෙවන ගාස්තුව හැර පොලීසියට හෝ වෙනත් කිසිදු කෙනෙකකුට අමතර ගාස්තු ගෙවන්න නැහැ.

මහාධිකරණයෙන් පමණක් ඇප ගන්න පුලුවන් වරදවල් තියෙනවා. මිනීමැරීම,රාජ්‍ය විරෝධි වැරදි වගේ වැරදි වලට ඇපගන්න පුලුවන් මහාධිකරණයෙන් පමණයි.ඊට අමතරව හෙරෝයින් ලගතබා ගැනීම,පීඩාකාරි අයුධ ලග තබා ගැනීම ,ආගමන විගමන පනත යටතේ සමහර වැරදි,මුහුදු මංකොල්ල කෑම්,රේගු වැරදි වගේ වැරදි වලටත් මහාධිකරණට තමයි ඇප දෙන්න පුලුවන්.

ඇප ඉල්ලුම්පතක් ඉදිරිපත් කලාම පොලීසිය ඊට විරෝධතා ගොනු කරනවා.සමහර පුද්ගලයො හරි වංචනික පොලිස් නිළධාරීන් හරි විරෝධතා ගොනු කරන්න ඔබෙන් මුදල් ඉල්ලන්න පුලුවන්.එහෙම කිසිම මුදලක් ඔබ දෙන්න අවශ්‍ය නැහැ.අධිකරණය නියම කරන දිනට ඔවුන් විරෝධතා දමන්න ඕනෑ.ඉහත සාකච්ඡා කලා වගේ ඇපකරුවන් සහ මුදල් සූදානම් කරගෙන සිටීම වැදගත්.ඔබ මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවකට අභියාචනයක් කරල තියෙනවනම් අනිවාර්යයෙන්ම අභියාචනා

පිටපත් වලට මුදල් ගෙවන්න ඕනැ. නැත්නම් ඔබගේ අභියාචනය නිශ්ප්‍රභා පුලුවන්.

ඔබට ඇපකරුවකු වන්න කියලා ඉල්ලීමක් කලොත් සැකකරු සම්බන්ධව පොඩි හරි අවිශ්වාසයක් තිබෙනවනම් ඇප වෙන්න එපා.මොකද සැකකරු අධිකරණය මගහැර හිටියොත් ඇපකරුවන්ට දඩුවම් විදින්න වෙනවා.අනෙක් අතට ඔබ සැකකරුවෙක්නම් ඔබේ ඇපකරුවන් ගැන හිතල අධිකරණය මගහරින්නේ නැතිව සෑම  දිනකම නඩුවට එන්න ඕනැ. ඇපකරුවොත් සෑම නඩු දිනයක් ගැනම සැලකිල්ලෙන් ඉන්න ඕනැ සැකකරු එනවද කියලා.

සිවිල් නඩුවල අභියාචනා විභාග කරන මහාධිකරණය

අපි ඉහත සාකච්ඡා කරපු දිසා අධිකරණයේ තීන්දු වලට විරුද්ධව ඔබ අභියාචනා කරන්නේ මේ අධිකරණයට.ඒ අධිකරණයේ සමාන්‍යයෙන් විනිසුරුතුමන්ලා දෙදෙනෙක් ඉන්නවා.ඊට අමතරව අපි පසුව  සාකච්ඡා කරන රීට් අධිකරණ බලයත් මෙම අධිකරණයට තියෙනවා.පළාත් සභාවලට ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවෙන් අධ්‍යාපනය ,සෞඛ්‍යය වැනි සමහර ක්ෂේත්‍ර වලට අදාලව බලතල දීලා තියෙනවා.ඔබ ඒ වගේ පළාත් සභාව  යටතේ රජයේ රැකියාවක් කරලා යම් අසාධාරණයකට  ලක් වුනානම් හරි පළාත් සභාවේ යම් පරිපාලන තිරණයකින් පීඩාවට පත්වෙනවනම් මේ අධිකරණයෙන් රිට් ආඥාවක්  ඉල්ලන්න පුලුවන්.

වාණිජ  ගනුදෙනු පිලිබදව නඩු  විභාග කරන වාණිජ මහාධිකරණය

මේ අධිකරණය ගැනත් අපි ඉහත සාකච්ඡා කලා.රුපියල් මිලියන 5ට වැඩි ගනුදෙනු ඒ කියන්නේ බැංකු ණය,ලීසිං වගේ මුල්‍ය පහසුකම් වගේ දේවල් සම්බන්ධ නඩු පවරන්න පුලුවන් මේ උසාවියේ.හැබැයි ඒ ගනුදෙනුව බස්නාහිර පළාත ඇතුලේ සිද්ධ වෙලා තියෙන්න ඕනැ.ඊට අමතරව ඔබ ලියපු පොතක් හරි ගීතයක් හරි වෙන කෙනෙක් ඔබගේ අවසරයක් නැතිව භාවිතා කරල මුදල් උපයනවනම් ඒක වලක්වන්න පුලුවන් බුද්ධිමය දේපල පනත යටතේ නඩු දාලා.ඒවගේ නඩුත් දාන්නේ මේ අධිකරණයේ.ඒ වගේම සමාගම් වල ආරවුල් විසදන්න පුලුවන් මේ උසාවියේ නඩු දාලා.අපි බේරුම්කරණය කියලා හඳුන්වන මෙහි පහත අපි සාකච්ඡා කරන නඩු වල තීන්දු ක්‍රියාත්මක කරන්නේත් මේ උසාවිය මගින්.

## 1.d <u>අභියාචනාධිකරණය</u>

අභියාචනාධිකරණයට මහාධිකරණයෙන් ඉදිරිපත් කරන අභියාචනා විමසීමේ බලය තියෙනවා.අපරාධ නඩුවල මුලික අධිකරණය බලය මහාධිකරණයට ඇති අවස්ථාවල ඒවාගේ අභියාචන ඉදිරිපත් කරන්න ඕන අභියාචනාධිකරණයට.අභියාචනාධිකරණයට ඇති වැදගත්ම බලය තමයි රිට් බලය. යම් රජයේ ආයතනයක් විසින් තම යුතුකමක් පැහැර හරින විට හරි යම් නීතියට පටහැනි දෙයක් සිදුකරන විට හරි අපිට පුලුවන් අභියාචනාධිරකණයෙන් රිට් ආඥා ඉල්ලන්න.එම ආඥා මගින් යම් තීරණයක් ගන්න හරි ක්‍රියාත්මක කරන්න හරි අදාල රජයේ නිළධාරියාට බල කරල නියෝග දෙනවා. නැත්නම් සිදුකරන යම් නීතිවිරෝධි ක්‍රියාවක් නතර කරන්න නියෝග දෙනවා. ඒ වගේම යම් පුද්ගලයෙක් නිතියට පටහැනි විදියට රජය විසින් රදවා තබාගෙන ඉන්නවනම් අධිකරණයට ඉදිරිපත් කරන්න කියල නියෝග ගන්න පුලුවන්.

## 1.e ශ්‍රේෂ්ඨාධිකරණය

ශ්‍රී ලංකාවේ ඉහලම අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන අතර පහත සදහන් කරුණු සම්බන්ධයෙන් අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

- මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ කාරණා.
- අවසාන අභියාචනා බලය (එනම් ඕනෑම පහල අධිකරණයක් විසින් ලබාදෙන තීරණයක් වෙනස් කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුවේ.)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපනය සම්බන්ධ කාරණා.
- ජනාධිපතිවරණ මැතිවරණ පෙත්සම් සම්බන්ධ කාරණා.
- උපදේශනාත්මක අධිකරණ බලය
- නීතිඥවරුන්ගේ විනයවිරෝධී කටයුතු පිලිබදව විභාග කිරීම.

(2)

## 2. ඔබට දැනගැනීමට වැදගත් කරුණු නඩු වර්ගීකරණය ඇසුරින්

2.a <u>අපරාධ නඩු</u>

අපරාධ නඩුවක නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙහෙයවන්නෙ පොලිසිය විසින්. මහාධිකරණයේදී නීතිපති දෙර්තමේන්තුව විසින්.අපරාධ නඩු ගැන අපි ඉහත යම් ප්‍රමාණයකට සාකච්ඡා කලා.මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ මහාධිකරණයේ විභාග වන අපරාධ නඩුවලදී ඔබ අපරාධයට ලක්වුනු තැනැත්තා නම් සාක්ෂිකරුවන් පොලීසිය විසින් හරි රජයේ නීතීඥවරු හරි නිසි පරිදි කැඳවනවද කියලා සැලකින්ලෙන් ඉන්න ඕනෑ.ඔවුන්ට ඔබගේ සහය ලබාදෙන්න කටයුතු කරන්න.අවශ්‍යනම් ඔබගේ අයිතිවාසිකම් වෙනුවෙනුත් අමතර නීතීඥයෙක් පත්කර ගන්න.

ඔබ චුදිතයෙක් නම් කල්තියා නීතීඥවරුයෙකු හමුවෙලා උපදෙස් දෙන්න.ඇප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා මුලින්ම අවධානය යොමු කරන්න. පසුව නඩු විභාගයට හැම දිනකම සහභාගී වෙලා වරෙන්තු වීම වලක්වා ගන්නා.ඇපකරුවන්ගේ

ආරක්ෂාව ගැන නිතරම සැලකිලිමත් වෙන්න.නීතීඥවරුන්ට නඩු විශාල ප්‍රමාණයක් තියෙන නිසා නිතරම තමන්ගේ නඩුව ගැන නීතීඥවරයා සමග කථා කරන්න.නඩුවට කලින් නීතීඥවරයාව හමුවන්න.

පොලීසිය හරි නිතීඥවරු විදියට පෙනී සිටින කූඨ තැනැත්තන්ට හසුවීම වැලැක්වීම පිණිස කල්තියාම විවිධ පාර්ශව වලින් විමසා සුදුසු නීතීඥයෙකු තෝරා ගන්න.නඩු දිනය නීතීඥවරයාගෙන් හරි කාර්යාලයෙන් හරි නිවැරදිව සටහන් කර ගන්න.ඇප කොන්දේසි නිවැරදිව අනුගමනය කරන්න.

## 2.b <u>ඉඩම් නඩු</u>

ඉඩම් නඩු වල ආරවුලේ ස්වභාවය අනුව නඩු වර්ග කීපයක් හඳුනා ගන්න පුලුවන්

<u>**අයිතිය ප්‍රකාශකරවා ගැනීමේ නඩු**</u>- ඔබට ඉඩමක් සඳහා අයිතිවාසිකම් ලබාගන්න පුලුවන් විකුණුම් ඔප්පුවක්,තෑගි ඔප්පුවක් මගින්.ඊට අමතරව උරුමයෙන් අයිතිවාසිකම් ලැබෙන අවස්ථා තියෙනවා.සමහර අවස්ථාවල දීර්ඝ කාලයක් භුක්ති විදලා අයිතිවාසිකම් ඉල්ලන් පුලුවන්.

ඔබට පැහැදිලි ඔප්පු මගින් දේපලට අයිතියක් ඇවිල්ල තියෙන අවස්ථාවක ඒ අයිතිය හොර ඔප්පු හදලා හරි වෙනත් පරස්පර ඔප්පු මගින් හරි,භුක්තියේ හිටියා කියලා හරි කවුරුහරි අභියෝග කරන අවස්ථාවක තමන්ගේ අයිතිය ප්‍රකාශකරවා ගන්න නඩු පවරන්න පුලුවන්.ඔබගේ දේපල සම්බන්ධව යම් වංචනික ඔප්පුවක් සකස් කරල තියෙනවනම් ඒ බව දැනගෙන වසර 3ක් ඇතුලත නඩු දමන්න කටයුතු කරන්න ඕනෑ.සමහර අවස්ථාවල

අපි පොලීසියට පැමිණිලි කලාට පසුව පොලීසිය කුඨ ලේඛණය ගැන අපරාධ නඩු පවරනවා.හැබැයි ඒ අපරාධ නඩුවෙන් චුදිතයා වැරදි කාරයා වුනත් ඔප්පුව අවලංගු වෙන්නේ නැහැ.ඒකට අයිතිය ප්‍රකාශකරවා ගැනීමේ නඩුවක් දමන්න ඕනැ.

අයිතිය ප්‍රකාශකරවා ගැනීමේ නඩුවක ඔබ පැමිණිලිකරුනම් ඔබ අනිවාර්යයෙන්ම ඔබගේ අයිතිය ඔප්පු මගින් පෙන්වන්න ඕනැ.මීලගට දේපල පිඹුරු මගින් හදුනා ගන්න ඕනැ.

ඔබ වසර 10කට වඩා එක දිගට භුක්ති විදින දේපලකට දේපලේ අයිතිකරු නඩුවක් දමලා අයිතිය ප්‍රකාශකරවා ගන්න ඉල්ලන්න පුලුවන්.ඔබ හරි ඔබට කලින් හිටපු අය හරි එම දේපලට ආවේ කුලී නිවැසියන් විදියට හරි අයිතිකරුගේ අවසරය මත හරි නොවේනම් ඔබ අයිතිකරුගේ කිසිම බාධාවක් නැතිව දේපල භුක්ති වින්දානම් ඒ මත ඔබට කාලාවරෝධි අයිතිය ගන්න ඉල්ලීමක් කරන්න පුලුවන්.එහිදී ඔබ භුක්තිය පෙන්වන ලේඛන අධිකරණයට ඉදිරිපත් කරන්න ඕනැ.

**භුක්තික නඩුකර**-ඔබට දේපලකට අයිතිය නැති වුනත් ස්වාධින බුක්තියක් තිබෙන අවස්ථාවක එම භුක්තිය අධිකරණ නියෝගයක් නැතිව අහිමි කලොත් එසේ අහිමි කර වසරකුත් දිනයක් ඇතුලත භුක්තික නඩුකරයක් පවරන්න පුලුවන්.එහිදී ඔබ ඔප්පු කරන්නෙ ඕනැ ඔබට භුක්ති විදින්නේ කුමන පදනමක් මතද සහ ඔබව අධිකරණ නියෝගයකින් තොරව දේපලෙන් නෙරපා ඇති බවයි.

**මායිම් නිශ්චය කරගැනීමේ නඩු**-ඔබගේ දේපලේ අයිතිය පිලිගන්න පාර්ශවයක් හදිසියේම මායිම් තමන්ට අවශ්‍ය විදියට

වෙනස් කලොත් දේපලේ මායිම් පැහැදිලි  කරගන්න නඩු දමන්න පුලුවන්.

**<u>ගෙවල් කුලී නෙරපීම් නඩු</u>**-දේපලක් කුලියට දිය හැකි ආකාර දෙකක් තියෙනවා.ඒ ව්‍යාපාරික දේපලක් විදියට සහ නිවාස දේපලක් විදියට.ඔබ දේපලක් කුලියට දුන්න තැනැත්තෙක්නම් ඔබ දැනගත යුතු කරුණු යම් ප්‍රමාණයක් තියෙනවා.ඒ වගේම ඔබ කුලී නිවැසියෙක්නම් ඔබ සතු අයිතිවාසිකම් ප්‍රමාණයකුත් තියෙනවා.

සාමාන්‍යයෙන්  කුලී ගිවිසුමක් ඇතිව හෝ නැතිව දේපලක් කුලියට දෙන්න පුලුවන්.සාමාන්‍ය නීතිය යටතේ එහෙම කුලියට දීපු දේපලකින් කුලියට ඉන්න තැනැත්තා ඉවත් කරන්න අවශ්‍යනම් මාසයක  නොතීසියක් දීලා කුලී නිවැසි භාවය අවසන් කරන්න ඕනෑ.එහෙම අවසන් කලාට පස්සෙත් කුලියට ඉන්න තැනැත්තා  යන්නේ නැත්නම් උසාවියේ නඩුවක් දාලා තමයි ඉවත් කරන්න ඕනෑ.එහෙම සාමාන්‍ය නීතියට යටත් වන දේපලක කුලියට ඉන්න තැනැත්තෙක්ට ලොකු කුලී නිවැසි අයිතිවාසිකම් ප්‍රමාණයක් හිමි වන්නේ නැහැ.

හැබැයි කුලියට ඉන්න දේපල ගෙවල් කුලී පනතට යටත් වෙනවානම් ගෙවල් හිමියාට වඩා වැඩි කුලී අයිතිවාසිකම් ප්‍රමාණයක් කුලී නිවැසියාට හිමි වෙනවා.වර්ශ1980 ට කලින් හදපු නිවාස දේපලක් නම් ඒ දේපල  ගෙවල් කුලී පනතට යටත් වෙනවා. ව්‍යාපාරික දේපලක් 1968ට කලින්  හදපු දේපලක් නම් එම වර්ශයේ අදාල දේපලට නගර සභාවේ කන්සේරුව හරි ඊට පස්සේ හදපු එකක්නම් පලමුවරට කරපු තක්සේරුව මත තමයි තීරණය කරන්න  පුලුවන් ගෙවල් කුලී පනතට වැටෙනවද කියලා.

ඔබ කුලී නිවැසියෙක්නම් දේපල ගෙවල් කුලී පනතින් පාලනය වෙනවානම් එම පනතේ සදහන් හේතු මත විතරයි ඔබව දේපලින් ඉවත් කරන්න පුලුවන්. ඊට අමතරව නිවාස හිමියාට තමන් කැමති කුලියක් ගන්න බැහැ.සම්මත කුලියක් තියෙනවා ගන්න පුලුවන්.ඔබ ගෙවල් කුලි හිග තබා තිබුනොත් ඔබව ඉවත් කරන්න මාස 3ක නොතීසියක් එවන්න ඕනැ.එහෙම එව්වත් ඔබ කුලිය ගෙවීමට කටයුතු කලොත් නඩු දමන්න බැහැ.ගෙවල් හිමියාට ඇති එකම දේපල කුලියට දුන්න දේපලනම් මාස 6ක නොතීසියක් දීලා නඩු පවරලා කුලී නිවැසියාව පනත අනුව ඉවත් කරන්න පුලුවන්.

දේපල කුලී පනතින් පාලනය වුනත් නැතත් ඔබ කුලී නිවැසියෙක්නම් දේපල හිමිකරුගේ අවසරය නැතිව දේපලේ නව ඉදිකිරීම් හරි කඩා බිදදැමීම් හරි කරන්න බැහැ.ඒ වගේම දේපල නිති විරෝධි ක්‍රියා සදහා භාවිතා කිරීම සිදු කරන්න බැහැ.ඒ වගේ අවස්ථාවල නොතීසියක් රහිතව දේපලෙන් ඉවත් කරන්න නඩු දමන්න පුලුවන්.

සමහර කුලී නිවැසියන් තමන්ට විරුද්ධව නඩු දැමු විට තමන්ගේ උත්තරයෙන් කුලී හිමියාගේ දේපලට ඇති අයිතිය පිලිනොගැනිම සදහා උත්සාහ කරනවා.ඔබ දේපලට භුක්තියට පැමිණියේ කුලී නිවැසියෙකු විදියට නම් එහි අයිතිකරුගේ අයිතිය අභියෝග කරන්න බැහැ.එහෙම අභියෝග කරනවානම් මුලින්ම ඔබ දේපලෙන් ඉවත් වෙලා තමයි කරන්න ඕනැ.

ඔබ සතු දේපලක් කුලියට දීමට යනවානම් දේපල කුලී පනතින් පාලනය වන වෙලාවක විශ්වාසවන්ත කෙනෙක්ට පමණක් කුලියට දෙන්න. අනෙක් අතට ඔබ කුලී පනතින් පාලනය වන

දේපලක කුලියට ඉන්නවානම් ඔබ සතු අයිතිවාසිකම් විශාල ප්‍රමාණයක් තියෙන බවත් දැන ගන්න ඕනැ.

## 2.c <u>බුදල් නඩු</u>

යම් තැනැත්තෙක් රුපියල් මිලියන 5කට වඩා වටින දේපල තියලා මිය ගියොත් අනිවාර්යයෙන්ම බුදල් නඩුවක් දාලා තමයි දේපල උරුමකරුවන්ට ලබාගන්න පුලුවන්.මියගිය කෙනා අන්තිම කැමති පත්‍රයක් තියලා ගිය වෙලාවක ඒ අන්තිම කැමති පත්‍රය දිසා අධිකරණයට ඉදිරිපත් කරලා ඔප්පු කරන්න ඕනැ.අන්තිම කැමති පත්‍රයක් නැති වෙලාවක දමන බුදල් නඩුවේදී මුලින්ම අධිකරණය බුදලයට අයත් දේපල පාලනය කරන්න අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් සුදුසු කෙනෙකුට දෙනවා.ඔහු තමයි උරුමකරුවන් අතර දේපල බෙදලා දෙන්නේ.අන්තිම කැමති පත්‍රයක් තියෙන වෙලාවකදී එහි නම් කරපු තැනැත්තාට ප්‍රොබේට් බලපත්‍රය ලබා දෙනවා.

අන්තිම කැමති පත්‍රයක් නැති අවස්ථාවක සාමාන්‍ය නීතිය අනුවනම් දේපලින් ½ ක් බිරිඳටත් ඉතිරි ½ දරුවන්ටත් උරුම වෙනවා. දරුවො නැත්නම් මුලු බුදලයම බිරිඳට යනවා.බිරිඳ නැත්නම් දරුවන්ට යනවා.මැරුණ කෙනා බැඳලා නැත්නම් බුදලය දෙමව්පියන්ට හිමිවෙනවා. දෙමව්පියන් නැත්නම් සහෝදර සහෝදරයින්ට උරුම වෙනවා.කිසිම උරුමකරුවෙක් නැත්නම් රජයේ මහා භාරකාරවරයාට දේපල පවරගන්න පුලුවන්.මුස්ලිම් නීතිය අනුව බෙදෙන විදිය වෙනස් වෙනවා.

## 2.d <u>බෙදුම් නඩු</u>

පරම්පරා ගාණක් තිස්සේ බොහෝ අවස්ථාවල ඉඩම් හවුලේ භුක්ති විදගෙන එනවා.එක වෙලාවකදී එකට භුක්ති විදින්න බැරිවුනාම බෙදුම් නඩුවක් දාලා තමයි බෙදා ගන්න පුලුවන්.බෙදුම් නඩු ගැන කථා කලාම ලංකාවේ වැඩිම කාලයක් යන නඩු වර්ගය තමයි බෙදුම් නඩු කියන්නේ.

මුලින්ම බෙදන්න බලාපොරොත්තු වෙන දේපල සහ දැනුමේ හැටියට කොටස් යන්න ඕන විදිය දක්වලා පැමිණිල්ලක් දිසා අධිකරණයට යොමු කරන්න ඕනැ. ඊට පස්සේ මිනින්දෝරුවරයෙක් දේපල මනිනවා.ඊට අමතරව අඩබෙර ගහල දේපල මනින බව කියනවා.මතක තියාගන්න ඕන කරුණ තමයි සමහර අය තමන්ට කොහොමත් අයිතිය තියෙන නිසා නඩු වල පැටලෙන්න මොකද කියලා හිතලා නඩුවට ඉදිරිපත් වෙන්නේ නැහැ.ඒ අණුවන ක්‍රියාව කලොත් තමන්ට කොච්චර පරණ අයිතියක් තිබ්බත් බෙදුම් නඩුවෙන් අයිති වෙන අයට දේපල දීලා යන්න වෙනවා.

නඩුවට ඉදිරිපත් වුන අය සාක්ෂි මගින් තමන්ගේ අයිතිවාසිකම පෙන්වන්න ඕනැ.ඒක ඔප්පු මගින් වෙන්නත් පුලුවන්. භුක්තියෙන් ලැබුනු අයිතියක් වෙන්නත් පුලුවන්.නඩුව අවසානයේ අධිකරණය එක් එක් කෙනාට හිමි කොටස තීරණය කරලා ඒ කොටස ප්‍රායෝගික විදියට මැනල බෙදල දෙනවා.

හැබැයි පුලුවන්නනම් පොඩි පොඩි කැපකිරීම් හැමෝම කරලා බෙදුම් නඩුවේ මුල් අවස්ථාවේදීම සමථ වෙලා බෙදා ගන්න පුලුවන්නම් පරම්පරා 3කට වඩා යන නඩුවක් ඉක්මනට ඉවර කර

ගන්න පුලුවන්.ඒ වගේම බෙදුම් නඩුවක් නොදා සමගි බෙදුම් ඔප්පුවකින් බෙදා ගන්නත් පුලුවන්.

## 2.e <u>මුදල් අයකර ගැනීම සදහා නඩු</u>

මේ වර්ගයේ නඩු විවිධ හේතු මත පැනනගිනවා ඒවා තමයි,

I. ණයට දුන්න මුදලක් අයකරගන්න
II. භාණ්ඩ ණයට විකුණපු අවස්ථාවල මුදල් අයකර ගන්න
III. රිය අනතුරක් හෝ වෙනත් අනතුරක් නිසා වන්දි අයකරගන්න
IV. රක්ෂණ මුදලක් අයකර ගන්න
V. අපහාසයක් කල විටක වන්දි අයකර ගන්න
VI. ද්වේශ සහගතව නඩු පැවරුවාම වන්දි අයකර ගන්න

මුදල් අයකරගන්න නඩුවක් දාන්න කලින් දැනගන්න ඕනැ වැදගත්ම දේ තමයි ලිඛිතව තමන් හරි නීතීඥයෙකු හරහා හරි මුදල් ඉල්ලලා යවලා තියෙන්න ඕනැ.ගිවිසුමක් මතනම් මුදල් ඉල්ලන්නේ ඒ ගිවිසුම අධිරකරණයට ඉදිරිපත් කරන්න ඕනැ.ගිවිසුමේ බේරුම්කරණයට යන්න ඕනැ කියලා තියෙනවානම් අනිවාර්යයෙන්ම බේරුම්කරණයට යා යුතුයි. නඩු පවරන්න බැහැ.මීට ඉහත විස්තර කරපු කාල රාමු තුල නඩු පවරන්නත් ඕනැ.

## 2.f <u>කල්බදු/කුලී සින්නක්කර/ක්‍රෙඩිට් කාඩ් නඩු</u>

වාහන හරි යන්ත්‍ර හරි ගන්න දැන් වඩාත්ම ජනප්‍රිය ක්‍රමය මෙය තමයි. වෙළදපොලට එය අධික භාණ්ඩ ප්‍රමාණය මිලදීගන්න පාරිභෝගිකයින් පොලඹවන ක්‍රම තමයි මේවා. හැබැයි වාරික

ගෙවන්න බැරි උනොත් පොලියත් එක්ක විශාල ගණනක් ආපසු ගෙවන්න වෙනවා. කල්බදු/කුලී සින්නක්කර නම් වාහනයත් අහිමි වෙනවා.

කල්බදු/කුලී සින්නක්කර ගිවිසුම් වලට එනකොට තමන්ට ගෙවාගෙන යන්න පුලුවන් වාරිකයක් හදාගන්න බලන්න.කල්බදු වලට වඩා කුලී සින්නක්කර ගිවිසුම්වල පාරිභෝගිකයාට අයිතිවාසිකම් හිමි වෙනවා.කල්බදු පහසුකමකදී අන්තිම වාරිකය හරි ගෙවන්න බැරි උනොත් වාහනය සමාගමට ආපසු ගන්න පුලුවන්. කුලී සින්නක්කර ගිවිසුමකදී 75% වාරික ගෙවලනම් වාහනය සමාගමට ගන්න බැහැ.

ඔබ මේ වගේ ගිවිසුමකට එළෙඹන අවස්ථාවේදීම ගිවිසුමේ පිටපතක් සමාගමෙන් ඉල්ල ගන්න.සමාගම හරියට ගෙවන මුදල් සඳහා කුවිතාන්සි නිකුත් කරනවද බලන්න.ගිණුම් වාර්තාවක් ඔබට සමාගම එවන්නේ නැත්නම් ඔබ ගිහින් හරි වාර්තාවක් ලබා ගන්නා.සමාගමට ලිඛිතව ගිවිසුම අවසන් නොකර වාහනය ආපසු ගන්න බැහැ.ඒ නිසා බැරිවෙලාවත් ගිවිසුම අවසන් නොකර වාහනය ගත්තොත් පොලිස් පැමිණිල්ලක් දාලා උසාවියේ නඩුවක් මගින් දේපල ආපසු ගන්න උත්සාහ කරන්න පුලුවන්.

ක්‍රෙඩිට් කාඩ්පතක් ලබා ගත්තත් ගිණුම් වාර්තා නිතරම පරීක්ෂා කර බලන එක වැදගත්.තමන්ගේ ණය සීමාව තුල ගනුදෙනු කරන්න ඕනෑ.නැත්නම් පොලිය විශාල වශයෙන් එකතු වෙනවා.මාසිකව ගෙවීමට ඇති අවම මුදල ගෙවන එක දිගටම කරන්න.ක්‍රෙඩිට් කාඩ් එකට අදාල ගිවිසුමේ පිටපතක් තමන් සතුව තියා ගන්න බලන්න. සමහර විට ක්‍රෙඩිට් කාඩ් එකත් සමග අතිරේක කාඩ්පතක් බිරිදට හෝ ස්වාමියාට දෙන අවස්ථා තියෙනවා.එහෙම අවස්ථාවලදී සැලකිලිමත් වෙන්න ඕනැ ඒ

මගින් නොදැනීම ණය ප්‍රමාණය වැඩි වෙනවා.ඒක නිසා පුලුවන් තරම් කාඩ්පත් එකකට පමණක් සීමා වෙන්න බලන්න.

කල්බදු/කුලී සින්නක්කර ගිවිසුම් වලදී ඇපකරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු ඇප වෙන්න ඕනැ.හුගක් අය බරපතල කම ගැන හිතන්නේ නැතිව ඇපකරුවන් වෙනවා. ඔබ ඇපකරුවෙක් වුනොත් ණය ගන්න කෙනා නොගෙව්වොත් ඇපකරුවනුත් ණයකරු වගේම වගකීමට බැදෙනවා.ඒක නිසා පුලුවන් තරම් ඇපකරුවන් නොවී ඉන්න බලන්න. වෙනවානම් හිතවත්ම විශ්වාසවන්ත සහ ණය ගෙවන්න පුලුවන් කෙනෙක් වෙනුවෙන් විතරක් ඇප වෙන්න.

## 2.g <u>දික්කසාද නඩු</u>

විවාහයක් ලියාපදිංචි කරන්න පුලුවන් වසර 18 සම්පූර්ණ වුනාම.එහෙම ලියාපදිංචි කරපු විවාහයක් විසුරුවා හරින්න පුලුවන්හේතු 3ක් මත විතරයි.ඒ තමයි එක් පාර්ශවයක් අනාචාරයේ හැසිරී තිබීම,ද්වේශ සහගතව අතහැර යාම සහ විවාහ වන අවස්ථාවේ තිබුණු සුවකල නොහැකි ලිංගික බෙලහීනතාව.

ඒ වගේම විවාහ වන අවස්ථාවේදී එක් අයෙකුගේ හෝ වයස 18ට අඩුනම් හරි වෙනත් විවාහයක් ලියාපදිංචි කරලා තිබුනනම් හරි විවාහය මුලපටන්ම අවලංගු වෙනවා.

දික්කසාදයේදී දරුවන් ඉන්නවානම් අපි ගොඩක් ඒ අය ගැන සැලකිලිමත් වෙන්න ඕන.කොයිතරම් ආදරේ වුනත් දරුවන්ගේ අනාගතය ගැන හිතලා තීන්දු තීරණ ගන්න ඕන.දරුවන්ගේ අධ්‍යාපනය සහ සුබසාධනයට වඩාත්ම සුදුසු කවුරු ලග ඉන්න

එකද කියලා හිතලා ඒ කෙනාට දරුවන්ගේ භාරකාරත්වය දෙන්න.හැබැයි අනෙක් කෙනාට අයිතියක් විදියටම දරුවන්ව බලන්න අවස්ථාව දෙන්න ඕන.දරුවන්ගේ නීති කටයුතු සඳහා භාරකාරත්වය දෙදෙනාටම සම සමව ගන්න පුලුවන්.

## 2.h වන්දි නඩු

විවිධාකාර වන්දි නඩු තියෙනවා.රිය අනතුරු වුනාව වාහනයේ අයිතිකරු,රියැදුරු සහ රක්ෂණ සමාගමෙන් වන්දි ඉල්ලලා නඩු දාන්න පුලුවන්.වැදගත්ම දේ නම් අනතුර වෙලා අවුරුදු දෙකක් ඇතුලත නඩු දාන්න ඕනැ.

ඊට අමතරව යම් අපහාසයක් සිදුකල අවස්ථාවකදී නාමයට කීර්ති සිදුවුනු හානිය සම්බන්ධයෙන් වන්දි ඉල්ලන්න පුලුවන්.ඒකත් අපහාසය සිදුවෙලා අවුරුදු දෙකක් ඇතුලත වෙන්න ඕන.

පොලීසිය හරි වෙන කෙනෙක් හරි ද්වේශ සහගත අදහසකින් ඔබට විරුද්ධව නඩු දැම්මොත් ඒ සම්බන්ධවත් වන්දි ගන්න පුලුවන්.ද්වේශ සහගතව දාපු නඩුව ඉවර වුනාම තමයි වන්දි නඩුව දමන්න ඕන.

ඒ වගේම කාන්තාවක් සමග විවාහ නොවී ලිංගිකව සම්බන්ධ වෙලා කන්‍යා භාවය නැති කලහොත් ඒ මගින් ඇයට මුහුණ දෙන්න වෙන ගැටලු සම්බන්ධවක් වන්දි අයකරගන්න පුලුවන්.විවාහ වෙනවා කියලා පොරොන්දු දීලා රවටපු අවස්ථාවලත් වන්දි ඉල්ලන්න පුලුවන්.

## 2.i <u>විශේෂ නඩු</u>

සමිති සමාගම් වල අරවුල් දේශපාලන,පක්ෂවල ආරවුල් වගේ ගැටලු විශේෂ නඩු විදියට පවරනවා.තවත් සමහර ගිවිසුම් මගින් ඇතිවන ආරවුලුත් විශේෂ ගණයට වැටෙන්න පුලුවන්.ඒ වගේම නඩුවක පැමිණිලිකරු හෝ විත්තිකරු බාලවයස්කාරයෙක් නම් ඔහු වෙනුවෙන් නඩුව පවත්වාගෙන යන්න මුලින්ම වැඩිහිටියෙකු පත් කරන්න ඕන.ඒ සදහාද විශේෂ නඩු පවරනවා.

## 2.j <u>භාර නඩු</u>

සමහර විට සල්ලි ණයට දෙන අයගෙන් ණයක් ගන්න කොට ඇපයක් විදිහට දේපළක් තියන්න කියනවා.හැබැයි උකස් ඔප්පුවක් වෙනුවට ලියන්නෙ විකුණුම්කරයක්.තවත් සමහර වේලාවට දන්නා හඳුනන කෙනෙකුට ණයක් ගන්න හරි ළමයි පාසලකට දාගන්න ලිපිනය දෙන්න හරි දේපළ පැවරීම කරනවා.එහෙම පවරන ලද දේපලක් ආපසු ඔබට පැවරුවේ නැත්නම් භාර නඩුවක් දාලා තමයි ආපසු අයිතිය ගන්න පුලුවන් .නඩු විභාගයේදි ඔබ ඔප්පු කරන්න ඕනෑ තමන් ඇත්තටම එහෙම පැවරීමක් කලේ නැහැ කියලා. දේපලේ ඇත්ත වටිනාකම ඔප්පුවේ දාලා තියෙන වටිනාකමට වඩා වැඩියි කියල.අනෙක් අතට දේපළ භුක්ති විදින්නේ ඔබයි කියලා.ඔබ ණයක් නම් ගත්තේ පොලි ගෙවුවා කියලා.

නඩු යන එක වළක්වා ගන්න ණය ගන්න වේලාවට උකස් ඔප්පුවක් මිස පැවරුම් ඔප්පු ලියන්න දෙන්න එපා.පොලී ගෙවන වෙලාවට අනිවාර්යයෙන්ම කුවිතාන්සියක් ඉල්ලා ගන්න.වෙනත් පැවරීමකදි පවරන හේතුව තාවකාලික එකක් කියලා ලිඛිතව ගන්න.

## 2.k **<u>66 වගන්තිය යටතේ නඩු</u>**

මේ නඩු වර්ගය පවරන්නේ මහේස්ත්‍රාත් අධිකරණයේ.මෙහිදී වන්නේ යම් දේපලක භුක්තියට තවත් කෙනෙක් බාධා කරනවානම් හරි භුක්තිය බලෙන් ගත්තොත් හරි සිවිල් නඩුවකින් ආරවුල විසදගන්න තෙක් මහේස්ත්‍රාත් වරයා මැදිහත් වෙලා සාමය ආරක්ෂා කරගන්න නියෝගයක් දෙන එක. පොලිසිය ආරවුල වර්තා කරපු දින වන විට කවුරුවත් භුක්තියෙන් ඉවත් කරලා නැත්නම් උසාවිය බලන්නේ ඒ දිනය වන විට භුක්තියේ හිටියෙ කවුද කියලා.හැබැයි භුක්තියෙන් කවුරුහරි ඉවත් කලා කියලා චෝදනාවක් තියෙනවනම් පොලිස් වාර්තාවට මාස 2ක් ඇතුලත භුක්තියේ හිටියෙ කවුද කියල බලලා ඒ කෙනාට භුක්තිය දෙනවා.

කොහොම නමුත් ඉඩම් ආරවුල විසදගන්න පුලුවන් වන්නේ දිසා අධිකරණයට ඉඩම් නඩුවක් දාලා තමයි.

## 2.l **<u>රජයේ ඉඩම් පිලිබද නඩු</u>**

බොහෝ රජයේ ඉඩම් ජනතාව බලපත්‍ර මත බුක්ති විදිනු ලබයි.මුලින්ම ඉඩම සංවර්ධනය කිරීම සදහා බලපත්‍රය ලබාදෙන අතර එය නිසි පරිදි සංවර්ධනය කල බවට ප්‍රාදේශිය ලේකම් වරයා සෑහීමකට පත්වන්නේ නම් එම බලපත්‍රය ජනාධිපතිවරයා අත්සන් කර ප්‍රධානයක් මගින් ලබාදෙයි.බලපත්‍රයක් හෝ ප්‍රධානයක් මගින් ලබාදෙන ඉඩම් කැබලි කර බෙදාදීමේ හැකියාවක් නැති අතර අදාල බලපත්‍රය හෝ ප්‍රදානය හිමි තැනැත්තාට තමාගෙන් පසුව දේපල හිමිවිය යුතු තැනැත්තා නම් කර තැබිය හැක. නැත්නම් අන්තිම කැමති පත්‍රයක් මගින් නම්කල හැක.එසේ නම් කිරීමක් ඇති විට අදාල නම්කල තැනැත්තාට පසු

අයිතිය  ලබාගත හැක.එසේ නම් කිරීමකින් තොරව මියගියොත් ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට දේපල හිමිවන අතර ඔවුන්ද ජීවත්ව නැති විට මුලින්ම  වැඩිමල්  පිලිවෙලට පිරිමි දරුවන්ටද පසුව ගැහැණු දරුවන්ටද හිමිවේ.

අන්තිම කැමති පත්‍රයක් ඇති විට එය අධිකරණයේ තැන්පත්  කර ඔප්පු කරන්න ඕනැ.බලපත්‍රය හෝ ප්‍රදානය ලබාදීමේදී යම් වැරුද්දක් සිදුව ඇත්නම් අභියාචනාධිකරණයේ රිට් ආඥාවක් ලබාගන්න පුලුවන්.අනෙක් අතට භුක්ති විදින දේපලේ භුක්තියට යම් ගැටලුවක්  ඇතිවුනොත් දිසා අධිකරණයේ නඩු පවරන්න පුලුවන්.

## 2.m <u>මානව හිමිකම් නඩු</u>

මුලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ කරණා අපට නිතරම ඇසීමට ලැබෙන මැසිවිල්ලක් වන අතර ඒ පිලිබඳව නිවැරදි අවබෝධයක් ලබාදීම මෙහි අරමුණයි.පුද්ගලයන්ගේ  මුලික අයිතිවාසිකම්  කඩවීමකදී  ගතයුතු නිවැරදි නීතිමය පියවර නොදැනීම තුල එම වින්දිතයන් ඉතා අසරණ තත්වයට පත්වේ. එම කරුණු පිලිබදව නිවැරදිව දැනුවත් වීම තුළ ඔබට ඔබගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබාදී ඇති අයිතිවාසිකම් සහතික කර ගත හැක.

**ඔබගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඔබට ලබාදී ඇති මුලික අයිතිවාසිකම් මොනවාද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය පුරාවට මුලික අයිතිවාසිකම් සම්බන්ධ ව්‍යවස්ථා අන්තර්ගත වන අතර එම අයිතීන් කඩවූ විට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලබන

පෙත්සමක් මගින් ඊට සහන ලබාගත හැක.එම මූලික අයිතීන් පහත අයුරින් පෙළගැස්විය හැක.

**ව්‍යවස්ථා අංක 10 -** සිතීමේ නිදහස,හෘදසාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස

**ව්‍යවස්ථා අංක 11 -**වධ හිංසාවලින් තොරවීමේ නිදහස සහ කෲර අමානුෂික අවමන් සහගත සැලකීමෙන් තොර වීමේ නිදහස.

උදා: පොලිස් අත්අඩන්ගුවේ සිටින විට පුද්ගලයකුට කරනු ලබන පහර දීමක් මේ යටතේ ප්‍රශ්න ගතකල හැක.

**ව්‍යවස්ථා අංක 12 -** සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

උදා: නීතියේ රැකවරණය සැමට සාධාරණ ලෙස ලැබීම තහවුරු කරයි.

**ව්‍යවස්ථා අංක 12(1) -**කිසිදු පුද්ගලයකු වෙනස්කමකට හෝ විශේෂත්වයකට භාජනය නොවිය යුතු බව.

උදා: පුද්ගලයකුගේ ජාතිය, ආගම, වර්ගය, කුලය ,භාෂාව ,ස්ත්‍රී පුරුෂ භාවය හෝ දේශපාලන මතය මත වෙනස්ව සැලකීමක් සිදුවේනම් එවැනි තත්වයන් මෙම ව්‍යවස්ථාව යටතේ ප්‍රශ්න කල හැක. එසේවුවද අබල තැනැත්තන් ,කාන්තාවන් හා ළමුන් සම්බන්ධයෙන් නීති මගින් විශේෂ විධිවිධාන සැලැස්වීම මේ යටතේ ප්‍රශ්න කල නොහැක.

**ව්‍යවස්ථා අංක 13-** අන්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රදවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීමෙන් නිදහස.

උදා: එනම් පුද්ගලයකු අත්අඩංගුවට ගත හැක්කේ නීතිය මගින් දක්වා ඇති කර්යපටිපාටියට අනුකූලව පමණක් බවයි.තවද එම අත්අඩංගුවට ගැනීමට අදාල වරද පිළිබදව එම පුද්ගලයාට දැනුම්දිය යුතුය.එසේම පුද්ගලයකු වරදකරු කලහැක්කේ එම ක්‍රියාව කරන අවස්ථාවේදී එය වරදක් බවට කිසියම් නීතියක

දක්වා ඇත්නම් පමණි අතීතයට බලපාන පරිදි නීති පැනවීම මෙමගින් තහනම්කර ඇත.

**ව්‍යවස්ථා අංක 13(2 ) -** අත්අඩංගුවට ගන්නා ලද තැනැත්තකු හැකි ඉක්මනින් ලගම පිහිටි අධිකරණයට ඉදිරිපත් කල යුතු අතර,එසේ නොමැතිව පුද්ගලයන්ගේ නිදහස සීමා කිරීම නොකළ යුතුය.

උදා: මහේස්ත්‍රාත්වරයාගෙ අවසරයකින් තොරව පොලිස් ස්ථානය තුල පැය 24 කට වඩා සැකකරුවකු රඳවා තබාගත නොහැක.

**ව්‍යවස්ථා අංක 13(3)-**සාධාරණ නඩුවිභාගයක් ලැබීමට ඇති අයිතිය හා එහිදී නීතිඥවරයකු මගින් කරුණු කියාපෑමට ඇති අයිතිය.

**ව්‍යවස්ථා අංක 13 (4)-** නිසි බලය ඇති අධිකරණයකින් ලබාදෙන තීරණයකින් හැරුණු කොට කිසිදු පුද්ගලයකු සිරභාරයට ගැනීම හෝ මරණීය දඩුවමින් දඩුවම් නොකළ යුතුය.

**ව්‍යවස්ථා අංක 13 (5)-** වරදකරු යයි ඔප්පු කරන තෙක් පුද්ගලයකු නිර්දෝෂියයි පූර්ව නිගමනය කල යුතුය.

ඔබ විසින් සිහිතබා ගතයුතු වැදගත් කාරණයක් වන්නේ මෙම ව්‍යවස්ථා අංක 13 මගින් ඔබට තහවුරු කරදී ඇති අයිතීන් රාජ්‍ය ආරක්ෂාව ,මහජන ආරක්ෂාව වැනි කරණා වලදී සීමා කිරීමේ බලයක් රජය සතුවන බවයි.

උදා; ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔබ අත්අඩංගුවට ගනු ලැබුවහොත් ඉහත අයිතීන් බොහොමයක් ඔබට අහිමි වනු ඇත.

**ව්‍යවස්ථා අංක 14 -** භාෂණයේ රැස්වීමේ සමාගමයේ රැකියාවේ සහ යාම් ඊම් යනාදියේ නිදහස

උදා: මේ යටතේ අදහස් ප්‍රකාශ කිරීමට ,තමන්ට කැමති භාෂාවක් කතාකිරීමට , සමිති සමාගම් පිහිටුවා ගැනීමට, තම විශ්වාසයන් ඇදහීමට හා ප්‍රකාශ කිරීමට, ශ්‍රී ලංකාව තුල යාම් ඊම් හා කැමති රැකියාවක නිරත වීමට අයිතිය තහවුරු කරදී ඇත.

මෙම ව්‍යවස්ථා අංක 14 යටතේ ඔබට තහවුරු කරදී ඇති අයිතිවාසිකම් ඔබට භුක්ති විදිය හැක්කේ වාර්ගික හා ආගමික සහයෝගිතාවය තහවුරුකිරීම ,ජාතික ආර්ථිකය ආරක්ෂාකිරීම, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම හා අධිකරණයට අපහාස කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් පනවා ඇති නීතීන්ට යටත්ව පමණි.

**සෑම මූලික අයිතිවාසිකම් කඩවීමකදීම නීතිමය පියවර ගතනොහැක**

සෑම මූලික අයිතිවාසිකම් කඩවීමකදීම ඔබට නීතිමය පියවර ගත නොහැක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල දක්වා ඇති පරිදි විධායක හෝ පරිපාලන ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන කඩවීම් පමණක් ඔබට ප්‍රශ්න කල හැක. උදා; රජයේ පරිපාලන නිලධාරීන් ,පොලිස් නිලධාරීන් වැනි තනතුරු මගින් සිදුවන අයිතිවාසිකම් කඩවීම් පමණක් ඔබට ප්‍රශ්න කල හැකි අතර සාමාන්‍ය සිවිල් පුද්ගලයන් අතර සිදුවන ආරවුල් හරහා සිදුවන මූලික අයිතිවාසිකම් කඩවීම් මේ යටතේ ප්‍රශ්න කල නොහැක. තවත් වැදගත් කාරණයක් වන්නේ අධිකරණ නිලධාරීන් විසින් සිදුකරන අයිතිවාසිකම් කඩවීම් ද මේ යටතේ ආවරණය නොවේ. (ව්‍යවස්ථා අංක 17)

**කොපමණ කාලයක් තුල පෙත්සම ගොනුකළ යුතුද?**

ඉහත දක්වන ලද ඔබගේ අයිතිවාසිකමක් විධායක හෝ පරිපාලන ක්‍රියාවක ප්‍රතිඵලයක ලෙස කඩවී ඇත්නම් හෝ කඩවීමට ඉතා ආසන්න නම් අදාළ නඩු නිමිත්තෙන් මාසයක් ගතවීමට ප්‍රථම ඔබ හෝ ඔබගේ නීතිඥ මහතා විසින් ඒ පිලිබදව ශ්‍රෙෂ්ඨාධිකරණයට පෙත්සමක් මගින් ඉදිරිපත් කලයුතුය.මෙහිදී මතක තබාගත යුතු කරණය නම් මසක් ඉක්මවූ පසුව කරනු ලබන පැමිණිලි ප්‍රතික්ෂේප වීමේ වැඩි ඉඩක් පවතින බවයි එසේ වුවද ඔබ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ප්‍රථම අවස්ථාවේදීම පැමිණිල්ලක් ගොනු කර ඇතිනම් අදාල "මාසයක කාලය" තුළින් බලපෑමක් ඇති නොවේ.

එසේම ඔබ මේ ආකාරයෙන් ඉදිරිපත් කරනු ලබන සෑම පෙත්සමක්ම විභාගයට ගැනීමට ප්‍රථම ඒ සඳහා ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසර ලබාගත යුතු අතර එසේ අවසර ලදහොත් පමණක් ඔබගේ පෙත්සම විභාගයට ගැනීම සිදුවේ.මෙම අවසර දීම හෝ ප්‍රතික්ෂේප කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් දෙදෙනකුට නොඅඩු ගණනක් විසින් සිදුකල හැකි අතර එසේ අවසර ලබා දුනහොත් ඒ පිළිබද මාස දෙකක් ඇතුලත තීරණයක් ලබාදීමට ශ්‍රේෂ්ඨාධිකරය බැදී සිටින බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව පැහැදිලි කරයි එසේවුවද අධිකරණයේ නඩු ප්‍රමාණය අධික වීම තුල තීරණයක් ලබාදීමට වසර ගණනාවක් ගතවීම ප්‍රයෝගිකව දැකගත හැකිය.

## 2.n <u>පරිපාලන නඩු</u>

පරිපාලන නඩු අපි ඉහත සාකච්ඡා කලා.අභියාචනාධිකරණයට පුලුවන් රිට් ආඥා මගින් රජයේ ආයතන සහ නිළධාරින් සිදුකරන

වැරදි සහගත ක්‍රියා සහ ගන්නා තීරණ අවංලගු කිරීම සිදුකරන්න.ඒ වගේම වැදගත් තීරණ ගන්නේ නැත්නම් ගන්න කියල බලකරල නියෝගයක් දෙන්න.අදාල තීරණය දීලා සාධාරණ කාලයක් තුල ප්‍රමාදයකින් තොරව නඩු දමන්න ඕනැ.

## 2.o කාර්මික නඩු

ඔබ යම් පුද්ගලික ආයතනයක සේවය කරන කොට අසාධාරණ ලෙස ඔබව සේවයෙන් පහ කරන්න පුලුවන්.එහෙම වෙලාවක ඔබට ගන්න පුලුවන් පියවර කිහිපයක් තියෙනවා.ඔබව සේවයෙන් ඉවත් කරපු දිනයට මාස 6ක් ඇතුලත කම්කරු විනිස්චය සභාව කියන අධිකරණයට ගිහින් නඩු දාලා වන්දි ඉල්ලන්න පුලුවන්.සේවයේ යලි පිහිටුවන්න කියලත් ඉල්ලන්න පුලුවන්.නැත්නම් කම්කරු කොමසාරිස්වරයාට පැමිණිල්ලක් කරන්න පුලුවන්.එහිදීත් පරීක්ෂණයක් පවත්වනවා.

රජයේ සේවකයින්ටත් කම්කරු කොමසාරිස්වරයාට තමන්ට වුණු ගැටලු ගැන පැමිණිලි කරන්න පුලුවන්.දැන් රාජ්‍ය පරිපාලන කොමිෂන් සභාව සහ පොලිස් කොමිෂම වගේ ආයතන තියෙන නිසා ඒවට පැමිණිලි කරන්න පුලුවන්.එම කොමිෂන් සභාවල තීරණ වලින් සෑහීමකට පත් වන්නේ නැත්නම් අභියාචනා මණ්ඩලයට අභියාචනය කරන්න පුලුවන්.

## 2.p කුලවැද්දුම් නඩු

දරුවෙකු දරුකමට හදා ගැනීම සඳහා දිසා අධිකරණයේ කුලවැද්දුම් නඩුවක් පවරා නියෝගයක් ලබා ගත යුතුය.

## 2.q <u>නඩත්තු නඩු</u>

විවාහයක් විසුරුවා හැරීමට පෙර ස්වාමියා හෝ භාර්යාව අනෙක් පාර්ශවය විසින් හැකියාවක් තිබියදී තමන්ව නඩත්තු නොකරන බවට කරුණු පෙන්වා නඩත්තු නඩුවක් මගින් විවාහය විසුරුවීම දක්වා නඩත්තු අයකරගත හැක.සාමාන්‍යයෙන් දකින්නට ලැබෙන්නේ භාර්යාව විසින් ස්වාමියාගෙන් නඩත්තු ඉල්ලන නඩු තමයි.හැබැයි ස්වාමියාටත් බාධාවක් නැහැ නඩත්තු ඉල්ලන්න.අනෙක් අතට දරුවන්ට පුලුවන් දෙමාපියන්ගෙන් නඩත්තු ඉල්ලන්න.දරුවෙක්ට වයස 18 දක්වා නඩත්තු ලබාගන්න පුලුවන්. වයස25 ට අඩු අයටත් තමන්ට තනිවම උපයා ගන්න සුදුසු තත්ත්වයක් නැත කියල ඔප්පු කරල නඩත්තු ලබා ගන්න පුලුවන්.ආබාධිත අයට වයස් සීමාවක් නැතිව නඩත්තු ඉල්ලන්න පුලුවන්.මේ නඩු දමන්න ඕන මහේස්ත්‍රාත් අධිකරණයේ.

දරුවන් නොසලකන දෙමාපියන්ට තම දරුවන්ගෙන් නඩත්තු මුදලක් නඩත්තු මණ්ඩල හරහා ලබා ගැනීමේ හැකියාව ඇත.

(3)

## 3.ආරවුල් විසඳීම සඳහා වැදගත් වෙන වෙනත් ආයතන සහ ව්‍යුහයන්

### 3.a <u>සමථකරණය</u>

මේ වන විට රුපියල් ලක්ෂ 5කට අඩු වටිනාකමක් ඇති සිවිල් ආරවුල් අනිවාර්යයෙන්ම සමථ මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනැ.ඒ වගේම සුළු අපරාධ නඩුත් ඉදිරිපත් කරනවා. හැම ප්‍රදේශයකම ඒ ප්‍රදේශයේ පිලිගත් තැනැත්තන්ගෙන් සමන්විත සමථ මණ්ඩලයක් තියෙනවා. සමථ මණ්ඩලයට නීතීඥවරු එක්කන් යන්න බැහැ.එතනදී සාමකාමීව ගැටලුව විසදගන්න පුලුවන්න නම් වියදම් කරලා නඩු යන්න අවශ්‍ය වෙන්නේ නැහැ. සමථ වෙන්නේ නැත්නම් සමථ නොවීමේ සහතිකය දෙනවා.

### 3.b <u>බේරුම්කරණය</u>

බේරුම්කරණය කියන්නේ සමහර වාණිජ ගනුදෙනුවලට අදාල ගිවිසුම් වල තියෙන කොන්දේසියක්.දැන් සමහර කල්බදු ගිවිසුම් රක්ෂණ ගිවිසුම් වලත් බේරුම්කරණ වගන්ති තියෙනවා.එහෙම

වෙලාවක කරන්න ඕන ඒ ගිවිසුම මත ආරවුලක් ඇති වුනොත් ඔබ බේරුම්කරුවකු නම් කරලා අනෙක් පැත්තට ලියුමක් යවන්න ඕන.බේරුම්කරණ මධ්‍යස්ථානයක් හොයා ගන්නත් ඕන.දැනට එහෙම තැන් දෙකක් කොළඹ තියෙනවා.

ඊට පස්සේ අනෙක් පාර්ශවයටත් තමන්ගේ බේරුම්කරුවකු පත් කරන්න පුලුවන්.පසුව දෙපැත්තේම බේරුම්කරුවන් එකතු වෙලා තවත් විනිසුරුවරයෙක් පත්කරලා තුන්දෙනෙගෙන් යුත්ත මණ්ඩලයක් තමයි නඩුව අහන්නේ. අනෙක් පැත්ත බේරුම්කරුවෙක් පත්කලේ නැත්නම් ඔබ පත්කරන බේරුම්කරුට පුලුවන් තනිවම නඩුව අහන්න.

දැන් තියෙන ගැටලුව තමයි බේරුම්කරුවන් තුන් දෙනෙකුටයි,නීතීඥවරුන්ටයි,බේරුම්කරණ මධ්‍යස්ථානයටයි සියල්ලටම ගෙවන්න වෙන නිසා සාමාන්‍ය නඩුවකට වඩා වැඩි වියදමක් බේරුම්කරණයට යනවා.ඒක නිසා සාමාන්‍ය මිනිස්සුන්ට බේරුම්කරණයට යන එක අමාරු වැඩක් වෙලා.හැබැයි ගිවිසුමේ බේරුම්කරණ වගන්තියක් තියෙනවනම් සාමාන්‍ය අධිකරණයකට යන්නත් බැහැ.

බේරුම්කරණයක ඔබේ වාසියට තීන්දුවක් ආවොත් ඒක ක්‍රියාත්මක කරගන්න මහාධිකරණයට යන්න ඕන.ඔබට විරුද්ධව ආවොත් මාසයක් ඇතුලත මහාධිකරණයට අභියාචනය කරන්න ඕනැ.

| |
|---|
| ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය-අංක120/7,විද්‍යා මාවත,කොළඹ 7,0112688263<br>ICLP බේරුම්කරණ මධ්‍යස්ථානය- අංක53,ආනන්ද කුමාරස්වාමි මාවත,කොළඹ 7, 0112574145 |

3.c **කම්කරු විනිශ්චය සභාව**

අපි ඉහත කථා කලා කම්කරු විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරන්න පුලුවන් ආරවුල්.හැම මහාධිකරණ කලාපයකම කම්කරු විනිශ්චය සභා පිහිටුවල තියෙනවා.

3.d **කම්කරු කොමසාරිස්**

කම්කරු දෙපාර්තමෙන්තුවේ තමයි කම්කරු කොමසාරිස් කාර්යාලය තියෙන්නේ.ඕනෑම කම්කරු ආරවුලක් වෘත්තිය සමිති ගැටලුවක් ලිඛිතව පැමිණිල්ලක් විදියට කම්කරු කොමසාරිස්ට ඉදිරිපත් කරන්න පුලුවන්

| |
|---|
| ලිපිනය- කම්කරු දෙර්තමේන්තුව,නාරාහේන්පිට, කොඹ 5<br>දුරකථන-0112581142 |

## 3.e ණය සහන මණ්ඩලය

ඔබ ණයක් අරගෙන ඒසදහා දේපලක් ඇපයට තැබූ වෙලාවක ඇපය බේරන්න ණය දුන්න කෙනා අකමැති වෙනවනම් හරි,ඔබ ඇපයක් තියලා ණයක් දීලා ඇපය සින්න වීමෙන් පසුවත් ණය ගත්ත කෙනා යන්නේ නැත්නම් හරි මේ මණ්ඩලයට පැමිණිලි කරන්න පුලුවන්.එහෙම පැමිණිලි කලාම දිසා අධිකරණයේ නඩු දමන්න බැහැ. මෙම ආයතනය ඉතා සාර්ථකව ඒ වර්ගයේ අරවුල් සාමදාන කරන ආයතනයක්.

## 3.f ගෙවල් කුලී මණ්ඩලය

ගෙවල් කුලී පනතින් පාලනය වන දේපල සම්බන්ධව ආරවුල් මේ මණ්ඩලයට ඉදිරිපත් කරන්න පුලුවන්.සම්මත ගෙවල් කුලිය තීරණය කර ගැනීම, කුලී නිවැසිභාවය තහවුරු කරගැනීම,ගෙවල් අයිතිකරු සිදුකරන පීඩා සම්බන්ධව පැමිණිලි මේ මණ්ඩලයට ඉදිරිපත් කරන්න පුලුවන්.නගර සභා,ප්‍රාදේශිය සභා මූලික කර ගනිමින් ගෙවල් කුලි මණ්ඩල පිහිටුවල තියෙනවා.

## 3.g ඉඩම් අත්පත් කරගැනීමේ වන්දි සමාලෝචන මණ්ඩලය

රජයට පුලුවන් පොදු කාර්යයක් සදහා පුද්ගලික ඉඩම් අත්පත් කරගන්න. මුලින්ම රජය කරන්නේ අත්කරගන්න බලාපාරොත්තු වන ඉඩම ගැසට්කරන එක. ඊට පස්සේ ඔබේ ඉඩමක් ඊට අයිතිවෙනවානම් අත්පත්කරගැනීමේ නිළධාරිවරයා පවත්වන පරීක්ෂණයට ඔබ ඉදිරිපත් වෙලා අයිතිය පෙන්වන්න ඕනැ.වෙනත් පරස්පර අයිතිවාසිකම් නැත්නම් ඔබගේ අයිතිය

අත්පත්කරගැනීමේ නිළධාරියා තහවුරු කරනවා. අයිතිය පිලිබඳව ගැටලුවක් තියෙනවනම් දිසා අධිකරණයට ගැටලුව ඉදිරිපත් කරනවා.එහිදී ඔබට සාක්ෂි මෙහෙයවල අයිතිය තහවුරු කරන්න වෙනවා. අයිතිය තහවුරු කලාට පස්සේ ඔබට හිමිවන වන්දිය ලිඛිතව දන්වනවා.ඒ වන්දිය බොහෝ වෙලාවට සාමාන්‍ය වටිනාකමට වඩා අඩුවෙන් තමයි දෙන්නේ.ඒ වෙලාවට මාසයක් ඇතුලත ඉඩම් අත්පත් කරගැනීමේ වන්දි සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කරන්න ඕන වන්දිය වැඩි කර ගන්න.පිලිගත් තක්සේරුකරුවෙකුගේ සාක්ෂි මගින් නියම තක්සේරුව ඔබ පෙන්වන්න ඕන.

ලිපිනය-අංක70, දෙවන මහල, Y.M.B.A ගොඩනැගිල්ල,ඩී.එස්.සේනානායක මාවත, කොළඹ 8
දුරකථන-0112683972

## 3.h <u>මානව හිමිකම් කොමිෂන් සභාව</u>

අද වන විට ඉතා සක්‍රිය ආයතනයක් තමයි මානව හිමිකම් කොමිෂන් සභාව.රජයේ ආයතනයකින් හරි නිළධාරියෙක්ගෙන් හරි වුණු මානව හිමිකම් කඩවීමකදි හරි පරිපාලන වැරුද්දකදී හරි මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන්න පුලුවන්.ඉතා සරල මුද්‍රණය කරපු ඉල්ලුම්පතක් තියෙන නිසා හරි පහසුයි පැමිණිලි ඉදිරිපත් කරන්න.එහි සිටින කොමසාරිස්වරුගේ අධීක්ෂණය යටතේ කරන පරීක්ෂණයකින් පසුව නියෝගයක් දෙනවා.ඒ නියෝගය ක්‍රියාත්මක කරගන්න යාන්ත්‍රණයක් නැතිවීම අඩුපාඩුවක් තමයි.මානව හිමිකම් කඩවෙලා මාසයක් ඇතුලත කොමිෂන් සභාව වෙත පැමිණිලි කලොත් ශ්‍රේෂ්ඨාධිරණයේ නඩු පවරන්න අනිවාර්ය කාල සීමාව වන මාසයක කාලය පැන්නත් මූලික මිනිස් අයිතිවාසිකම් නඩුවක්

පවරන්න පුලුවන් වීම මෙම කොමිෂන් සභාවෙන් ගන්න පුලුවන් වාසියක් තමයි.

ලිපිනය-අංක 165, කිංසි පාර, බොරුල්ල.
දුරකථන-0112685980-1/ 0112689064

## 3.i <u>නීති ආධාර කොමිෂන් සභාව</u>

අපේ රටේ 60%ක් විතර ජනතාව තවමත් දුප්පත් සහ පහල මධ්‍යම පන්තික පවුල්.එන්න එන්නම නීතියේ පිහිට පැතිමට යන වියදම වැඩියි. ඒ නිසා නීති ආධාර කොමිෂන් සභාව විශාල කාර්ය භාරයක් කරනවා දුප්පත් ජනතාව වෙනුවෙන්. සෑම උසාවියකම වගේ නීති ආධාර කොමිෂන් සභා කාර්යාලයක් තියෙනවා.ඔබගේ අදායම් මට්ටම සනාථ කරන ලියවිල්ලක් ග්‍රාමසේවක මහත්මයාගෙන් අරන් ගිහින් ඒ නිළධාරින් මුන ගැහෙන්න.

ලිපිනය- අංක 129,අලුත්කඩේ වීදිය, කොලඹ 12
දුරකථන-0115335329

## 3.j ජාතික පොලිස් කොමිෂම

මේ කොමිෂන් සභා දැන් සක්‍රිය වෙලා තියෙන්නේ.පොලීසියෙන් ඔබට යම් අසාධාරණයක් වුනොත්පුලුවන්. මේ කොමිෂන් සභාවට ලිඛිතව පැමිණිලි කරන්න.

ලිපිනය-කාමර අංක 9, බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 7.
දුරකථන-0015107727

## 3.k ළමා ආරක්ෂන අධිකාරිය

ළමයෙක් සම්බන්ධව අපරාධයක් හරි යම් පීඩාවක් හරි සිදුවන වෙලාවක මෙම අධිකාරියට වහාම දැනුම් දෙන්න.එම අධිකාරියට පොලිස් බලතල හිමිවෙලා තියෙනවා එවැනි පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න.

ලිපිනය- අංක 330,තලවතුගොඩ පාර,ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.'
දුරකථන-0012778911-4

## 3.l පාරිභෝගික අධිකාරිය

පාරිභෝගිකයින් විදියට අප මුහුණ දෙන ගැටලු වලදී පාරිභෝගික අධිකාරිය වෙත පැමිණිලි කරලා සහන ගන්න පුලුවන්. පාරිභෝගික අධිකාරිය විසින් ආපන ශාලා හෝටල් ආදිය

වටලලා නඩු පවරන අවස්ථා තියෙනවා.ඔබ මිලදී ගත් උපකරණ වගකීම් කාලයතුල කැඩුනු විට අදාල ආයතනය ඊට සහනයක් දෙන්නේ නැත්නම් සහ භාණ්ඩයේ තත්ත්වය හොද නැත්නම් පාරිභෝගික අධිකාරියට පැමිණිලි කරන්න පුලුවන්.

ලිපිනය-අංක 27, චොක්ෂල් වීදිය, කොළඹ 2.
දුරකථන-01177564 56-7

3.m **<u>පුවත්පත් පැමිණිලි කොමිසම</u>**

යම් පුවත්පතක එල වන යම් පුවතක් නිසා ඔබ අපහසුතාවකට ලක්වෙනවානම් හරි අසත්‍ය දේ එල කරල තියෙනවනම් හරි පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කරන්න පුලුවන්.

ලිපිනය-අංක 96, කිරුල පාර,කොළඹ 5
දුරකථන-0115353635

3.n **<u>නීතිඥ සංගමය</u>**

යම් නීතිඥවරයෙක් වෘත්තිය කටයුතු වලදී ඔබට වංචාවක් සිදුකලොත් හරි හිතාමතාම නඩුව ඔබට අවාසි තත්ත්වයකට පත් කලොත්, වෘත්තිය ආචාර ධර්ම කඩ කලොත් නීතිඥ සංගමය වෙත පැමිණිලි කරන්න පුලුවන්.

නීතිඥ සංගමයේ නීති ආධාර පදනම කියන ආතනයෙන් නීති ආධාර ලබාගන්න පුලුවන්.

ලිපිනය- අංක 153, මිහිඳු මාවත, කොළඹ 12.
දුරකථන-0112447134

3.o **වෛද්‍ය සභාව**

යම් වෛද්‍යවරයෙක් වෘත්තිය කටයුතු වලදී ඔබට වංචාවක් සිදුකලොත් හරි වෘත්තිය ආචාර ධර්ම කඩ කලොත් වෛද්‍ය සභාව වෙත පැමිණිලි කරන්න පුලුවන්.

ලිපිනය- අංක 31,නොරිස් කැනල් පාර,කොළඹ 10
දුරකථන-0112674787

3.p **කාති උසාවිය**

මුස්ලිම් නීතිය යටතේ විවාහ වුන තැනැත්තන් සිය වෛවාහක ආරවුල් ඉදිරිපත් කල යුත්තේ කාති උසාවියට වේ.

3.q **වකුෆ් මණ්ඩලය**

මුස්ලිම් පල්ලි හා බැදුනු දේපල පිලිබඳ ආරවුල් විභාග කරනු ලබයි.පල්ලියක් මගින් පාලනය වන දේපලක් සම්බන්ධව දිසා අධිකරණයේ නඩු පවරන්නේනම් මෙම මණ්ඩලය මගින් අවසරය ලබාගත යුතුයි.

# (4)

## 4.ඔප්පු ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

ඔප්පු ලියනකොට සිදුවන වැරදි නිසා බොහොම දෙනෙක් අසරණ තත්ත්වයට පත්වෙනවා.ඒක නිසා ඉඩමක් මිලදී ගන්නකොට සැලකිලිමත් වෙන්න ඕන.

මුලින්ම සමාජයේ පිලිගත්ත නොතාරිස්වරයෙක් තෝරගන්න එක වැදගත්.යන වියදම ගැන හිතලා කවුරුහරි කෙනෙක් ගාවට යනවට වඩා හොදට කරුණු හොයල නොතාරිස්වරයා ගාවට යන්න.මිලදී ගන්න ඉඩමට අදාලව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කලින් ඔප්පු ලියාපදිවි වූ පත්ඉරු තියෙනවා.අවම වශයෙන් අවුරුදු 30ක්වත් ආපස්සට ඒ පත්ඉරු පරීක්ෂා කරවන්න. එතකොට නොතාරිස්වරයා දේපලට ලියාපදිංචි වී ඇති පරණ ඔප්පුත් බලල කියයි දේපලට නිරවුල් අයිතියක් විකුණන කෙනාට තියෙනවද කියලා.

එහෙම අයිතිය තහවුරු කරගත්තට පස්සේ ඔප්පුව ලියන ආකාරය තිරණය කරන්න.සාමාන්‍යයෙන් විකුණුම් ඔප්පුවකින් තමයි දේපල මිලදී ගන්නේ.ඔප්පුව ලියනකොට නොතාරිස්වරයාට අමතරව සාක්ෂිකරුවන් දෙදෙනෙක් ඔප්පුව අත්සන් කරන්න ඕනැ.ගෙවන්න ඕන මුද්දර ගාස්තුව විකුණුම් ඔප්පුවක්නම් පලමු

ලක්ෂයට රුපියල් 3000ක් ඊලග හැම  ලක්ෂයකටම රුපියල් 4000ක්.ඒ කියන්නේ ඉඩම මිලදී ගන්නේ රුපියල් ලක්ෂ 5කට නම් මුද්දර ගාස්තුව රු 3000+4000+4000+4000+4000=19000.මුද්දර ගාස්තු අඩුවෙන් ගෙවන්න හිතාගෙන දේපල මිලදී ගන්න ඇත්ත වටිනාකමට අඩුවෙන් දැන් ඔප්පු ලියන්න අමාරුයි. මොකද  පලාත් සභාවෙන් දේපල  වෙනම තක්සේරු කරනවා.

ඔබ ණය ගනුදෙනුවකට උකසක් විදියට දේපලක් තියනවනම් සැලකිලිමත් වෙන්න ඕන ලියන්නේ උකස්කරයක්  හරි කොන්දේසි සහිත  පැවරුම්කරයක් හරිද කියලා.සමහර වෙලාවට පැවරුම්කර ලියලා දේපලේ අයිතිය ගන්න ණය දෙනා කෙනා උත්සාහ කරන්න  පුලුවන්.ඔබේ දරුවන්ට  හරි භාර්යාවට හරි වෙනත් ආදරය කරන කෙනෙකුට තෑගි ඔප්පුවකින් දේපල පවරන්න පුලුවන්.එහිදී තෑග්ග දෙන කෙනා අත්සන්  කරල තෑග්ග භාරගන්න අවශ්‍ය වෙනවා.ඒවගේම තෑගි ඔප්පුවක්  ලිව්වට පස්සේ තෑග්ග තෑගි දුන්න කෙනාට ඔප්පුව අවංලගු කරන්න පුලුවන් උසාවියේ නඩුවක්  දාලා. එහිදී ඔහු ඔප්පු කරන්න ඕන තෑග්ග දුන්න කෙනා තමන්ට ආදරය කරුණාව දැක්වීම වෙනුවට වැරදි විදියට සැලකුවා කියලා.

ගෙයක් ඉඩමක් හරි  බද්දට දෙනවනම්  බදු ඔප්පු ලියන්න පුලුවන්.මුලු බදුකාලය තුල ගෙවන බදු වටිනාකමින් 1% ක් රජයට බදු විදියට ලියන්න ඕන.

බාලවයස්කාර අයට අයත් දේපල සහ උමතු පුද්ගලයින්ට අයිති දේපල උසාවි අවසරයකින් තොරව විකුණන්න බැහැ.ඒ වගේම මිය ගිය අයගේ දේපලක් පවරන්න පුලුවන් උසාවියෙන් බුදල් නඩුවකින් ගන්න බලපත්‍රයක් මත විතරයි.පිටරට ඉන්න

කෙනෙකුට තමන්ගේ දේපලක් විකුණන්න ලංකාවේ ඉන්න කෙනෙක්ට ඇටර්නි බලකරයක් මගින් බලය පවරන්න පුලුවන්.ඒ වගේ වෙලාවක මිලදී ගන්න කෙනා ඇත්තටම එහෙම ඇටර්නි බලකරයක් දීලා තියෙනවද කියලා හොයා බලන්න ඕනැ.ඇටර්නි බලය දෙන කෙනාත් විශ්වාසවන්ත කෙනෙකුට විතරක් බලය දෙන්න ඕනැ.

කොයිතරම් හොයල බලල ගත්තත් සමහර වෙලාවට වංචනික ඔප්පුවලට අපිව අහු වෙන්න පුලුවන් ඒ වගේම අපිට අයිති දේපලට වංචාවක් කරන්න යනවා කියලා ආරංචි වෙන්නත් පුලුවන්. ඒ වෙලාවට කේවියට් කියන තහනම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දමන්න වග බලා ගන්නා ඕන.

ඒ වගේම බෙදුම් නඩුවක් හරි වෙන නඩුවක් විභාග වෙන දේපලක් හරි, බැංකුවකින් තහනමට අරගෙන විකුණුම් සහතිකයක් නිකුත් කර නැති දේපලක් මිලදී ගන්න යන්න එපා.දේපලක් මිලදී ගද්දී ප්‍රදේශිය සභාව හරි නගර සභාවෙන් හරි පරීක්ෂා කරල බලන්න පාරට කොයිතරම් දේපලින් ඉවත් වෙන්න තියෙනවද කියලා. ඒ වගේම නොපවරා ගැනීමේ සහතිකය සහ හිමිකම් සහතිකය අදාල පළාත් පාලන ආතනයෙන් ලබා ගෙන පරීක්ෂා කරන්න ඕන.

# (5 )

## 5 .නඩු කටයුතු වලදී දැනගත යුතු වෙනත් කරුණු

**<u>අතුරු ඉන්ජන්ෂන් ආඥා</u>**

ඔබගේ ආරවුල ඉඩම් ආරවුලක් නම් අනෙක් පාර්ශ්වය දේපලේ යම් ඉදිකිරිමක් බලහත්කාරයෙන් සිදු කරයිනම් හෝ දේපල වෙනත් තැනැත්තෙකුට පැවරීමක් කිරිමට උත්සාහ දරයිනම් ඉඩම් නඩුවක් මගින් එය වැලැක්වීමට ඉන්ජන්ෂන් තහනමක් ගන්න පුලුවන්.එම ආඥාවක් මගින් නඩුව අහල අවසන් වෙනකම් ඒ තැනැත්තාව එම ක්‍රියා කරන එකෙන් වලක්වනවා.අනෙක් අතට බලහත්කාරයෙන් ඔබව දේපලකින් ඉවත් කලොත් නැවත භුක්තියේ පිහිටුවන්න විධානාත්මක ඉන්ජන්ෂන් ආඥා ලබාගන්න පුලුවන්.ඔබේ දේපලක කුලියට ඉන්න කෙනෙක් කුලි නොගෙවා බලහත්කාරයෙන් ව්‍යාපාරයක් කරන අවස්ථාවක එම ව්‍යාපාරය නතර කරන්න ඉන්ජන්ෂන් ආඥා ලබාගන්න පුලුවන්.දේපල සම්බන්ධ නැති වෙනත් සමිති සමාගම් පිලිබඳ ආරවුල්, පවුල් ආරවුල් වගේ දේවල් වලදීත් යම් ක්‍රියාවක් කිරීමෙන් වලක්වන්න ඉන්ජන්ෂන් ආඥා ලබාගන්න පුලුවන්.

## නඩු ප්‍රමාද වීම වලක්වා ගැනීම

නඩු ප්‍රමාද වීම සම්බන්ධ ගැටලුවට විසඳුමක් දීමට මේ ක්‍රමය ඉතා අවාසනාවන්ත විදියට අසමත් වෙලා තියෙනවා.ඒ නිසා පීඩාවට පත්වන තැනැත්තා ඔබයි.නඩු ප්‍රමාද වීම ගැන නීතීඥවරුන්ට මෙන්ම විනිසුරුවරුන්ට තියෙන වගකීම කිසිවිටක නොසලකා ඉන්න බැහැ.ඒ වගේම ඔබගේ පාර්ශවයෙනුත් නඩු ඉක්මන් කරගන්න කල හැකි යම් යම් දේ තියෙනවා.

විශේෂයෙන්ම නඩුවක් භාර දුන්න මුල් අවස්ථාවේ ඉදන්ම නීතීඥවරයා සමග නිතරම තමන්ගේ නඩුව ගැන සාකච්ඡා කරමින් සම්බන්ධතාව පවත්වාගනෙ යන්න.මුල් අවස්ථාවේදීම නිවැරදි උපදෙස් නීතිඥවරයාට දෙන්න.ලේඛණ සියල්ල නිසි පරිදි සකස් කරල නීතීඥවරයාට පෙන්වන්න.

නඩු දවසේදී පෙනී සිටීමක් නැති නිසා බොහෝ නඩු ඒක පාර්ශවිකව විභාගයට ගන්න විනිසුරුවරුන්ට සිදුවෙනවා.එතකොට නඩු අනවශ්‍ය විදියට කල් යනවා. අනෙක් අතට ඇත්තටම අතපසු වීමක් නිසා නඩුවක් ඒකපාර්ශවිකව විභාගයට නියම වුණු වෙලාවක අතපසු වීම ඇත්තටම සිදුවුනු දෙයක්නම් තමන්ගේ නීතීඥවරයාට කථා කරල අනෙක් පැත්තට නඩුවට නැවත ඇතුලත් වෙන්න ඉඩ දෙන්න.එතකොට නඩුව කල් යන එක හුගක් අඩු කර ගන්න පුලුවන්.

බෙදුම් නඩුවල වගේ තමන්ගේ ඇති අයිතිය පර්චස් 50 ක් කියමු. නමුත් පැමිණිල්ල අනුව තමන්ට හිමිවන්නේ පර්චස් 40 වගේ කොටසක් වන වෙලාවට ඇත්ත වශයෙන්ම මුල් අවස්ථාවේදීම පාර්ශව සාකච්ඡා කරලා අතරමැදි විසඳුමකට ඇවිල්ලා හැමෝම යම් පර්චස් ගණනක් කැප කරලා නඩුව සමථ වෙනවනම් අවුරුදු

30 විතර නඩු කියන එක වෙනුවට  වසර දෙක තුනකින් නඩුව අවසන් කරගන්න  පුලුවන්.බොහොමයක් බෙදුම් නඩු තේරුමක් නැතිව අපේ අනවශ්‍ය ආශාව  නිසා පරම්පරා 3ක් විතර විභාග වෙනවා.

හුගක් වෙලාවට දික්කසාද නඩු සදහා මුල් වතාවේ දෙදෙනා අතර තියෙන තරහ නිසා දික්කසාදය අවශ්‍ය නැහැ නඩුව කෙහොම හරි අනෙක් පැත්ත  පරද්දන්න කියලා සමහරු  කියනවා.දෙන්නට ඇත්තටම එකට ඉන්න බැරිනම්  නීතියෙන් එකතු  කරන්න බැහැනෙ.අන්තිමට දෙන්නම තමන්ගේ තරුණ ජීවිතයේ වසර 5ක් විතර වෙනත්  විවාහයක් කරගන්නවත් වෙනත් ප්‍රයෝජනවත් දෙයක් කරගන්න බැරුව අපතේ යවනවා.ඒ නිසා කොයිතරම් තරහ තිබුනත් මුල් අවස්ථාවේදීම සමගියෙන් දික්කසාද වෙන්න බලන්න.

අනෙක් අතට තමන්ගේ නීතීඥවරයා නඩුව අනවශ්‍ය විදියට කල්දමනවා වගේ පෙනෙන වෙලාවක ඔබට අයිතිය තියෙනවා තමන්ගේ නඩුව වෙනත් නීතීඥයෙකුට දෙන්න. මොකද නඩුව ඔබගේ පුද්ගලික දෙයක්. නීතීඥවරයෙක් ඉන්නේ ඔබට සහය දෙන්න මිසක් නීතීඥවරයාට නඩුවට අයිතියක් හිමිවෙන්නේ නැහැ.

ඔබට නීතීඥවරයා  හමුවෙලා අදාල ගාස්තු දීලා පලමු දිනයේදීම ඔබගේ උත්තරය හරි වෙනත් ලේඛණයක්  හරි ඉදිරිපත් කරවන්න කියලා උනන්දු කරවන්න පුලුවන්.තම අනෙක් රාජකාරි අතර වුනත් තම නඩුවට උනන්දු සේවාදායකයින් වෙනුවෙන් ප්‍රමුඛතාව ලැබෙන අවස්ථා තිබෙනවා.

**<u>ඔබ දැනගෙන සිටීම වැදැගත් වන කාර්ය පටිපාටික දේවල්</u>**

නඩුවක් විභාග වෙනකොට නීතියෙන් විධිමත් භාවය සඳහා විවිධ කාල සීමාවන් දමල තියෙනවා.ඒ දේවල් දැනගෙන ඉන්න එක වැදගත්.

- සිවිල් නඩුවක පලමු නඩු විභාග දිනයට දින 15කට පෙර අනෙක් පාර්ශවයට පිටපත් සහිතව තමන් නඩුවේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සාක්ෂි සහ ලේඛණ ලැයිස්තුවක් සකස් කරල ඉදිරිපත් කරන්න ඕනැ.
- බෙදුම් නඩුවකනම් සාක්ෂි සහ ලේඛණ ලැයිස්තු පලමු නඩු විභාග දිනයට මාසයකට පෙර ඉදිරිපත් කරන්න ඕනැ.
- නඩුවක මොකක්හරි පියවරක් ගන්න තියෙනවනම් අවුරුද්දක් ඇතුලත ඒ පියවර ගන්න ඕනැ.
- සිවිල් නඩුවක නඩු තීන්දුවක් තීන්දුවෙන් වසර 10ක් ඇතුලත ක්‍රියාත්මක කරගන්න ඕනැ.
- සිවිල් නඩුවක් නඩුවක් ඔබට විරුද්ධව ඒකපාර්ශවික විභාග වෙලා තීන්දුවක් භාරදුන්නොත් භාරදීලා දින 14ක් ඇතුලත ඒක අවලංගු කරන්න ඉල්ලීම කරන්න ඕනැ.
- නඩු තීන්දුවක් ක්‍රියාත්මක කරමින් නඩුවේ පාර්ශවයන් නොවන ඔබව දේපලකින් ඉවත් කලොත් ඉවත් කරපු දින සිට දින 15ක් තුල නැවත භුක්තිය ගන්න ඉල්ලීමක් කරන්න ඕනැ.
- දිසා අධිකරණ තීන්දුවකට විරුද්ධව තීන්දුව දිලා දින 14ක් තුල අභියාචනා කරන බවට දැන්වීම දීලා දින 6ක් තුල අභියාචනා පෙත්සම ඉදිරිපත් කරන්න ඕනැ.
- දිසා අධිකරණයක තීන්දුව නොවන අතරමැදි නියෝගයකට විරුද්ධව නියෝගය දිලා දින 14ක් තුල අභියාචනා කරන්න ඕනැ.

- මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවකට විරුද්ධව තීන්දුව දිලා දින 14ක් තුල අභියාචනා කරන්න ඕනැ.
- මහාධිකරණ තීන්දුවකට විරුද්ධව තීන්දුව දිලා දින 14ක් තුල අභියාචනා කරන්න ඕනැ.
- කම්කරු විනිස්චය සභා තීන්දුවකට විරුද්ධව තීන්දුව දිලා දින 30ක් තුල අභියාචනා කරන්න ඕනැ.
- ගෙවල් කුලී මණ්ඩලයේ තීන්දුවකට විරුද්ධව තීන්දුව දිලා දින 21ක් තුල අභියාචනා කරන්න ඕනැ.

<u>නීතීඥ ගාස්තු හැර නඩුවක ඔබට වැයවන ගාස්තු</u>

- ඔබට සාමාන්‍යයෙන් සිවිල් නඩුවක නඩුවේ වටිනාකම අනුව ලේඛන වලට මුද්දර ගාස්තු ගෙවන්න ඕනැ.රුපියල් 1000 කට රුපියල් 1 ක මුද්දර ගාස්තුවක් අයකරනවා.හැබැයි උපරිම මුද්දර ගාස්තුව රුපියල් 1000කට සීමා වෙනවා.
- සිවිල් අභියාචනාධිකරණයේ ඉහත ගාස්තුවම දෙගුණයක් වෙනවා.
- අභියාචනාධිකරණයේ පෙරකලාසිය,පෙත්සම සහ විරෝධතා වලට රු. 0 ක මුද්දර ගාස්තුවක් අවශ්‍ය වෙනවා.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් ගාස්තුවක් විදියට රු.200ක් නඩුව ගොනු කරද්දි අයකරනවා.
- බෙදුම් නඩු, කුලවැද්දුම් නඩු, මානව හිමිකම් නඩුවල මුද්දර ගාස්තු නැහැ.
- සාමාන්‍යයෙන් අධිකරණ නඩු වාර්තාවක සහතික පිටපතක් ගන්න ඡායා පිටපතකට රු 8ක් සහ යතුරු ලියනය කල පිටපතකට රු 20ක් පමණ වැයවෙනවා.
- දිවුරුම් ප්‍රකාශයකට රු.50 ක මුද්දරයක් අලවන්න ඕනැ.

ස්තුතිය

නීතීඥ වසන්ත පිටිගල  මහතාට
නීතීඥ අනුෂ වික්‍රමසිංහ මහතාට
Cybergate Services (Pvt) Ltd. ආයතනයට